ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

# ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය

**2024 - පෙබරවාරි**

# ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

**සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය**

**සංචාරක අංශය**

**696/4,මරදාන පාර,කොළඹ 10**

**2024 - පෙබරවාරි**

# ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය


ප්‍රකාශක : සංචාරක අංශය
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
696/4,මරදාන පාර
කොළඹ 10

ISBN :

මුද්‍රණය :


**ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අමාත්‍ය මණ්ඩලය විසින් 2024 පෙබරවාරි 26 වන දින අනුමත කරන ලදී.**
**(අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/24/0365/604/043 – 2024 පෙබරවාරි 26)**

පටුන


1. ප්‍රතිපත්තියේ නම 1

2. බලාත්මක දිනය 1

3. හැඳින්වීම 1

4. තාර්කිකත්වය 2

5. සංචාරක කර්මාන්තය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාවය 3

6. ජාතික සංචාරක ප්‍රතිපත්තියේ අරමුණ 4

7. ප්‍රතිපත්ති අභිමතාර්ථ 6

8. ජාතික සංචාරක ප්‍රතිපත්තියේ ප්‍රධාන තේමා 6

9. ජාතික සංචාරක ප්‍රතිපත්තිය සඳහා මූලධර්ම 8

10. ප්‍රධාන තේමා සඳහා ප්‍රතිපත්ති ප්‍රකාශන 8

10.1 ඒකාබද්ධ පාලනය 8

10.2 සංගෘහිත ආර්ථික වර්ධනය සහ තිරසාර සංචාරක සංවර්ධනය 9

10.3 වැඩිදියුණු කළ සේවා ප්‍රමිති, ඵලදායී සම්බන්ධතා සහ දැනුවත් කරන ලද පාර්ශවකරුවන් 9

10.4 නව ගමනාන්ත සංවර්ධනය, සංචාරක කර්මාන්තය ඔරොත්තු දෙන අයුරින් ගොඩනැගීම සහ දිරිගැන්වීමේ උපාය මාර්ග 10

11. ජාතික සංචාරක ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම 10

11.1 උපාය මාර්ග 10

11.2 වගකීම සහ අධිකාරිය 10

11.3 අධීක්ෂණය හා ඇගයීම 11

ඇමුණුම 1:පාරිභාෂික ශබ්ද මාලාව 12

ඇමුණුම 2:සංකේත නාම ලැයිස්තුව 15

ඇමුණුම 3: අදාළ ප්‍රතිපත්ති සහ පනත් ලැයිස්තුව 15

ඇමුණුම 4: ප්‍රධාන ප්‍රතිපත්ති තේමා හා උපාය මාර්ග 16 - 25

**01. ප්‍රතිපත්තියේ නම**

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

**02. බලාත්මක දිනය**

2024 පෙබරවාරි 26

**03. හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය විදේශ විනිමය උත්පාදනයට ඍජුව දායක වන අංශයක් වන අතර එමගින් මෙරට ආර්ථික වර්ධනයට ඉමහත් දායකත්වයක් දක්වමින් එය මෙහෙයවන ප්‍රධාන ක්‍රියාකරු ලෙසද හඳුනාගෙන ඇත. තවද, සංචාරක කර්මාන්තය තිරසර සංවර්ධනයක් ඇති කිරීම සඳහා ඉහල විභවතාවයක් සහිත උපාය මාර්ගික වශයෙන් ඉතාම වැදගත් අංශයකි. සංචාරක කර්මාන්තයේ වර්ධනය සහ තිරසර සංවර්ධනයක් සහතික කිරීම සඳහා විවිධාංගීකරණය වූ නවෝත්පාදන නව ආයෝජන අවස්ථා ඇති කරමින්, ඩිජිටල් වත්කම් මත පදනම් වූ නව රැකියා අවස්ථා බිහි කිරීම තුලින් ආදායම් උත්පාදනය වැඩි කිරීමට සහ දරිද්‍රතාවය අඩු කිරීම සඳහා සංචාරක කර්මාන්තය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් අවශ්‍ය වේ.

සංචාරක කර්මාන්තය සඳහා ජාතික සංචාරක ප්‍රතිපත්තියක් අවශ්‍ය වන්නේ රාජ්‍ය සහ පෞද්ගලික අංශයන් සමඟ ඒකාබද්ධව සියලුම සංවිධාන සහ පාර්ශ්වකරුවන් අතර උපායමාර්ගික සම්බන්ධතා වැඩි දියුණු කරමින් සංචරණය සහතික කිරීමටයි. ඒ අනුව, සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය ශ්‍රී ලංකාවේ ජාතික සංචාරක ප්‍රතිපත්තිය සකස් කිරීමට මූලිකත්වය ගෙන කටයුතු කරන ලදී. එම ක්‍රියාවලියේදී, ජාතික සංචාරක ප්‍රතිපත්තිය මගින් ආවරණය කෙරෙන ක්ෂේත්‍ර නිශ්චය කිරීම හා සංචාරක කර්මාන්තයේ ගැටලු සහ විභවතා හඳුනා ගැනීම සඳහා දේශීය හා ගෝලීය සන්දර්භයන් සැලකිල්ලට ගනිමින් පුළුල් අධ්‍යයනයන් සිදු කරන ලදී. ජාතික ප්‍රතිපත්ති සම්පාදන නියමාවලිය අනුගමනය කරමින්, අන්තර් අමාත්‍යාංශ සහ පළාත් මට්ටමින් රාජ්‍ය අංශයේ ආයතන, පෞද්ගලික අංශයේ පාර්ශවකරුවන් සහ සාමාන්‍ය ජනතාව සමඟ සාකච්ඡා මාලාවක් සංවිධානය කරන ලදී. සංචාරක කර්මාන්තයේ සංවර්ධනය සම්බන්ධයෙන් ඔවුන්ගේ අදහස් ලබා ගැනීම මෙහි අරමුණ විය. ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේ කොටසක් ලෙස ජාතික සංචාරක ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා උපාය මාර්ගික සැලැස්මක් සකස් කිරීම අවශ්‍ය වේ. ජාතික සංචාරක ප්‍රතිපත්තියට අනුකූලව එම උපායමාර්ගික සැලැස්ම මගින් ප්‍රතිපත්ති මැදිහත්වීම් ක්ෂේත්‍ර, ඉලක්ක, අරමුණු, උපාය මාර්ග, ක්‍රියාකාරකම්, කාල රාමු, ප්‍රතිදාන, ප්‍රතිඵල, බලපෑම්, ප්‍රධාන කාර්යසාධන දර්ශක, වගකීම් හා සීමාවන් මොනවාද යන්න සඳහන් කර ඇත.

2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතෙහි සඳහන් මාර්ගෝපදේශ, ප්‍රතිපත්ති රාමු සහ නීති සංග්‍රහ මගින් සංචාරක කර්මන්තය සහ එහි සංවර්ධන කටයුතු පාලනය වේ. එම නව පනත මගින් සංචාරක සංවර්ධන බද්ද හඳුන්වා දෙන ලද අතර, ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය වෙනුවට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) පිහිටුවන ලදී. පසුගිය දශක දෙක තුළ සංචාරක ව්‍යාපාරයේ පැවති ඉල්ලුම හා සැපයුම මත එය ප්‍රබල ලෙස පරිවර්තනය වුවත්, එම අංශය පාලනය සඳහා පවතින නිත්‍යානුකූල පරිශීලකය 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත වේ.

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2011 සිට 2016 කාල සීමාව දක්වා සංචාරක සංවර්ධන උපාය මාර්ගික සැලැස්මක් සකස් කර දියත් කර ඇත. ප්‍රධාන සංවර්ධන සැලැස්ම සහ ජාතික සංවර්ධන ප්‍රතිපත්ති න්‍යාය සැලැස්මෙහි දක්වා ඇති පාරිසරික, සමාජීය, සංස්කෘතික, ආර්ථික, ආයතනික සහ ප්‍රවර්ධන යන

ප්‍රධාන සංරචකන් පාදක කර ගනිමින් ඊට අනුකූල වන සේ එම සංචාරක උපාය මාර්ගික සැලැස්ම සකස් කර ඇත. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ දැක්ම 2025 අරමුණු කර ගනිමින් එම ගමනාන්තය කරා ප්‍රවේශ කිරීම සඳහා පසුකාලීනව 2017-2020 සංචාරක උපායමාර්ගික සැලැස්මක් සකස් කරන ලදී. කෙසේ වෙතත්, එම සැලැස්මද පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය හා ඉන් පසුව ඇතිවූ කොවිඩ්-19 වසංගතය ආශ්‍රිත දේශසීමා වසා දැමීම් හේතුවෙන් එම උපායමාර්ගික සැලසුම් කාලය අවසන් වූ අතර එය ක්‍රියාත්මක කිරීමට දැඩි බාධා එල්ල විය.

සංචාරක අංශයට අදාළ අනෙකුත් ප්‍රතිපත්ති සහ නීති යටතට 2003 අංක 25 දරන මුදල් පනත, 1980 අංක 47 දරන ජාතික පරිසර පනත, 1988 අංක 3 දරන ජාතික උරුම වන භූමි පනත, 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනත, 1980,1983,1992 සංශෝධිත, 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා පනත, ජාතික සංස්කෘතික ප්‍රතිපත්තිය (2007 දී යෝජනා කරන ලද නමුත් ක්‍රියාත්මක නොකළ), 2017 අංක 12 දරන විදේශ විනිමය පනත, ශ්‍රී ලංකාවේ කම්කරු සංග්‍රහය (2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය පනත ඇතුළුව), 1935 ඉඩම් සංවර්ධන ආඥාපනත (1935 අංක 19, 2010 සහ 2012 සංශෝධන ඇතුළුව නිරන්තරයෙන් සංශෝධනයට ලක් වූ), ශ්‍රී ලංකාවේ ජාතික සිවිල් ගුවන්සේවා ප්‍රතිපත්තිය (2016) ආදිය ඇතුළත් වේ.

## 04. තාර්කිකත්වය

### ආර්ථික වර්ධනයේ සහ තිරසාර සංවර්ධනයේ ප්‍රධාන නියමුවා ලෙස සංචාරක කර්මාන්තය

සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකා ආර්ථිකය මෙහෙය වන ප්‍රධාන අංශයක් ලෙස හඳුනා ගෙන ඇත. සංචාරක කර්මාන්තයේ සංවර්ධනය උදෙසා සියළුම ක්ෂේත්‍රයන්හි යටිතල පහසුකම් වැඩි දියුණු කරමින් පරිවර්තනීය වෙනසක් සිදු කිරීමට අවශ්‍ය සුදුසු උපාය මාර්ගික මැදිහත් වීම හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. මෙයට සමගාමීව, ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ වර්ධනයට සහ පෞද්ගලික අංශයේ සහභාගීත්වයට බාධා වන ප්‍රතිපත්ති, නියාමන සහ ආයතනික දුර්වලතා හඳුනා ගෙන සුදුසු ප්‍රතිසංස්කරණ හරහා විසඳුම් ලබා දීම අත්‍යවශ්‍ය වේ.

සංචාරක කර්මාන්තය විවිධ අංශ සමඟ ඒකාබද්ධව ඒවායේ සම්බන්ධීකරණයෙන් යුතුව සේවාවන් ලබා දෙන කර්මාන්තයකි. සංචාරක කර්මාන්තයේ සංවර්ධනය සහ සත්කාරක සේවා සැපයීම අමාත්‍යාංශ, පළාත් සභා ආයතන සහ පාලන නියෝජිත ආයතන මත රඳා පවතී. සංචාරක ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමේදී රජයේ මූලික කාර්යභාරය වන්නේ නියාමකයෙකු, සැලසුම්කරුවෙකු, යටිතල පහසුකම් සපයන්නෙකු, සන්නිවේදකයෙකු, සම්බන්ධීකාරකයෙකු සහ අභිප්‍රේරකයෙකු ලෙස ක්‍රියා කිරීම වන අතර, සංචාරක කර්මාන්තය මනාව කළමනාකරණය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම පෞද්ගලික අංශයයේ ප්‍රධාන කාර්යයකි.

2017-2020 සංචාරක උපායමාර්ගික සැලැස්ම නොයෙකුත් දුෂ්කරතා වලට මුහුණ දීමට සිදු වූ නිසා අර්ධ වශයෙන් ක්‍රියාත්මක විය. කොවිඩ් -19 වසංගතය හා ආර්ථික අර්බුදය පැවතීම නිසා සංචාරක ව්‍යාපාරයේ දුර්වල වූ සංවර්ධන වේගය ලඟාකර ගැනීමට යාවත්කාලීන කරන ලද ආයතනික, නෛතික සහ නියාමන රාමුවක අවශ්‍යතාවය මෙම ප්‍රතිපත්තිය මගින් අවධාරණය කර ඇත.

සංචාරක කර්මාන්තය ජාත්‍යන්තර වශයෙන් ආර්ථික, සමාජීය සහ තාක්ෂණික පරිවර්තනයන්ට භාජනය වෙමින් පවතින අතර, දේශගුණික විපර්යාස සහ තිරසර සංවර්ධන කතිකාවේ ප්‍රතිඵලයක් ලෙසද නව පාරිසරික සුසමාදර්ශයක් කරා ළඟා වෙමින් පවතී. පසුගිය දශක කිහිපය තුළ සංචාරක ක්ෂේත්‍රයේ ඇති වූ ප්‍රධාන ගෝලීය ප්‍රවණතා සහ පරිවර්තනයන් කිහිපයක් පහත සඳහන් කර ඇත.

- සංචාරක කර්මාන්තයේ නව ස්වරූප නිර්මාණය කරන සංචාරකයින්ගේ අපේක්ෂා වෙනස් කළ සුසමාදර්ශයන් (තිරසාරභාවය, යහපැවැත්ම සහ තිරසාර පරිභෝජන රටා කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම ඇතුළුව)

- තාක්ෂණික පරිවර්තනය සහ ඩිජිටල් ආර්ථිකය (ගෝලීය සංචාරක වටිනාකම් දාමයේ සුසමාදර්ශය වෙනස් වීම, නිදහස් ආර්ථිකය තුළ ක්‍රියාකරුවන්ගේ වැඩිවීම,)

- ජාත්‍යන්තර සහ දේශීය සංචාරක අංශ දෙකෙහිම අඛණ්ඩ සංවර්ධනය හේතුවෙන් ඇති වන සෘණාත්මක බාහිර බලපෑම (එක් සංචාරක ස්ථානයක දේශීය හා විදේශීය සංචාරකයින් මිශ්‍ර කිරීමේ දී ඇති වන ගැටළු; නැගී එන ආර්ථිකයන්හි පාරිසරික ආරක්ෂණ තත්වය අඩු මට්ටමක පැවතීම).

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ සංවර්ධනයට ස්වාභාවික ආකර්ෂණීය ස්ථාන සහිත ගමනාන්ත, සංස්කෘතික උරුමයන් සහ අව්‍යාජ සංචාරක අත්දැකීම් යන ප්‍රවනතා වැඩි වශයෙන් හිතකර වී ඇත. කෙසේ වෙතත්, ගුවන් ගමන් මත දැඩි ලෙස යැපීම හරිත ගමනාන්තයක් ලෙස රටට ඇති පිළිගැනීමට බලපෑම් ඇති කරනු ලැබිය හැකි ය. පාරිසරික, සමාජීය, සංස්කෘතික හා සදාචාරාත්මක වශයෙන් වගකියන සහ ආර්ථික වශයෙන් ශක්‍යතාවක් හෙබි, තිරසාර සංචාරක කර්මාන්තයක් මඟින් පරිසරය ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ සංස්කෘතික පුනර්ජීවනය වැනි ආර්ථික මෙන්ම ආර්ථික නොවන ප්‍රතිලාභ ද අත් කර දීමට දායක වනු ඇත.

සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම ජාතික ප්‍රමුඛතාවයකි. ඒ සඳහා, ස්වභාවික සම්පත් ආරක්ෂා වන අයුරින් වගකීමෙන් යුතුව පරිහරණය කිරීම, දේශීය ප්‍රජාවන්ගේ සාධාරණ මැදිහත්වීම සහ පාරිසරික සංචාරක කර්මාන්තයේ සුවිශේෂී අත්දැකීමක් අපේක්ෂා කරන ඉහළ පෙළේ සංචාරකයින්ට ශ්‍රී ලංකාව ආකර්ශනීය ගමනාන්තයක් බවට පත් කරනු ඇත. සංචාරක ව්‍යාපාරය සංවර්ධනය කිරීමේදී සියලුම පාර්ශ්වකරුවන්ට අපක්ෂපාතීව ප්‍රතිලාභ සහතික කරන අන්තර්-ආංශික සහයෝගීතාවයක් අවශ්‍ය වේ.

කොවිඩ්-19 වසංගතය මඟින් ජාත්‍යන්තර සංචාරක කර්මාන්තය නැවත නිර්වචනය කර ඇත. දිගු කාලීන ප්‍රවණතා අතරට සේවකයින් සඳහා දිගු කාලයක් රැඳී සිටීමට වීසා බලපත්‍ර ලබාදීම, ගෘහස්ථ සහ කලාපීය සංචාර කෙරෙහි අවධානය යොමු කිරීම සහ කුඩා කණ්ඩායම් සඳහා නව සංචාරක ක්‍රම හඳුනා ගත යුතුය. සංචාරක කර්මාන්තයට සෞඛ්‍ය අර්බුදය විසින් ඇති කළ තාක්ෂණික වෙනස්කම් වලට අමතරව සංචාරක ව්‍යාපාරයේ විධිමත් ක්‍රියාකාරීන් ආරක්ෂා කරන, අවිධිමත් දේශීය ක්‍රියාකාරීන් විධිමත් ප්‍රවාහයට ඇතුළත් කිරීම ප්‍රවර්ධනය කරන සහ විදේශීය/ජාත්‍යන්තර අවිධිමත් ක්‍රියාකාරීන්ගේ සහයෝගිතාව සහතික කරන නීතිමය රාමුවක් අවශ්‍ය වේ.

### 05. සංචාරක කර්මාන්තය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාවය

විදේශ විනිමය ඉපැයීම අතින් බලන විට සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකා ආර්ථිකයේ වැදගත් කුළුණකි. ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රයේ සංවර්ධනයට ඇති ප්‍රධාන බාධාව වන්නේ ආයතන අතර පවතින දුර්වල සම්බන්ධීකරණය සහ අකාර්යක්ෂම පාලනයයි. එමෙන්ම, දියුණු තාක්ෂණය සහ කර්මාන්ත ප්‍රමිති යොදා ගැනීමේ අවශ්‍යතාවය, සුරක්ෂණ හා ආරක්ෂක පිළිවෙත් ප්‍රමාණවත් නොවීම, නෛතික හා නියාමන රාමුව දුර්වල වීම, වෙළඳපල තොරතුරු සඳහා වන ප්‍රවේශය සීමිත වීම සහ ඒකාබද්ධ විශේෂ අවධානය යොමු කළ යුතු සංචාරක ගමනාන්ත ප්‍රවර්ධන වැඩසටහන් නොමැති වීම යන කරුණු ද මෙම බාධාවන් වලට ඇතුළත් වේ.

තවද, 2019 වර්ෂයේ සිදු වූ පාස්කු ඉරිදා ප්‍රහාරය හා 2022 වර්ෂයේ සිදු වූ ආර්ථික අර්බුදය වැනි අභ්‍යන්තර අභියෝගවලට ශ්‍රී ලංකාවට මුහුණ දීමට සිදු වූ බැවින් ඒවාට අනුගත වීමට සිදුවේ. කොවිඩ් -19 වසංගතය වැනි බාහිර අභියෝග වලින් පසු සංචාරක කර්මාන්තය යථා තත්ත්වයට පත් කිරීම හා දේශගුණික විපර්යාස වලට මුහුණ දීමට ජාත්‍යන්තර සංචාරක ක්ෂේත්‍රයට සිදු විය. විශේෂයෙන්ම, ශ්‍රී ලංකාව දූපත් ගමනාන්තයක් බැවින් අප රටට දේශගුණික විපර්යාස මගින් ඇති වන ආර්ථික හා පාරිසරික බලපෑම් ඇති කරනු ලබයි. මීට අමතරව, ගමනාන්තය තුළ පවත්නා වෙනත් අභියෝග රාශියක් ද රාජ්‍ය සහ පෞද්ගලික ක්‍රියාකාරීන් විසින් හඳුනා ගෙන ඇත. එබැවින්, ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට ඉහත කී ගැටලු මගහරවා ගැනීමට හා ගෝලීය වශයෙන් වඩාත් තරගකාරී වීමට ශක්තිමත් උපකාරයක් අවශ්‍ය වේ.

සංචාරක කර්මාන්තයට විවිධ ක්ෂේත්‍රවල මැදිහත්වීම් පවතින බැවින්, එම අදාළ අංශවල ප්‍රතිපත්ති සමඟ අනුගත වන, ඒකාබද්ධ වූ ජාතික සංචාරක ප්‍රතිපත්තියක් පැවතීම යුගයේ අවශ්‍යතාවයක් වේ. සංචාරක කර්මාන්තයේ සියලුම පාර්ශවකරුවන්ගේ (දේශීය හා ගෝලීය) අභිලාෂයන් ඇතුළත්, පුළුල් සංචාරක ප්‍රතිපත්තියක් මඟින් ශ්‍රී ලංකාවේ තිරසර හා අඛණ්ඩ ආර්ථික වර්ධනයක් සහතික කෙරෙනු ඇත.

## 06. ජාතික සංචාරක ප්‍රතිපත්තියේ අරමුණ

ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය තුළ මෙරට කඩිනම් සහ තිරසර සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමේ එක් මාධ්‍යයක් ලෙස සංචාරක කර්මාන්තය පිළිගෙන ඇත. එබැවින්, සංචාරක ක්ෂේත්‍රය සංවර්ධනය හා කළමනාකරණය කිරීමේ දී, එම අංශයේ සැලකිය යුතු වැඩි දියුණුවක් සඳහා ඉඩ ප්‍රස්ථාවක් පවතින බව එහි සඳහන් කර ඇත. තවද, ජාතික මට්ටමින් සංචාරක අංශයේ පවතින ඉඩ ප්‍රස්ථා සහ සීමාවන් පිළිබඳව මෙන් ම, ජාත්‍යන්තර වශයෙන් එහි පවතින ඉඩ ප්‍රස්ථා සහ අභියෝග පිළිබඳව තක්සේරුවක් කිරීම තුළින් සංචාරක ක්ෂේත්‍රයේ දැනට පවතින තත්ත්වයන් පිළිබඳ ව වඩාත් පැහැදිලි අවබෝධයක් ලබා ගත හැකිය.

සංචාරක කර්මාන්තයේ පවතින අඩුපාඩු සහ දුර්වලතා පහත දැක්වෙන පරිදි ප්‍රධාන මාතෘකා හයක් යටතේ දැක්විය හැක.

1. දුර්වල පාලනය (සංචාරක කර්මාන්තයට අදාළ සැලසුම්, කළමනාකරණය සහ ප්‍රතිපත්ති සම්පාදනය ඛණ්ඩනය වීම, සංචාරකයින්ගේ සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව අවම මට්ටමක පැවතිම)
2. තර්ජනයට ලක්ව ඇති සංචාරක වත්කම් (ලෝක ආර්ථික සංසදය විසින් ස්වාභාවික සම්පත් පිළිබඳ සංචාරක තරගකාරීත්ව දර්ශකයේ ශ්‍රේණිගත කිරීම)
3. වෙළඳපොළ ප්‍රවේශය සීමිත වීම (විශේෂිත වෙළඳපොළ පිළිබඳ තොරතුරු නොමැතිකම, ඉහළ ප්‍රතිලාභයක් සහිත වෙළඳපොළ වෙත ප්‍රවේශය සීමා සහිත වීම)
4. ආයෝජන සීමිත වීම (සංචාරක නිෂ්පාදන සීමිත වීම හා විවිධාංගීකරණය නොමැතිකම, සංචාරක කලාපවල පැහැදිලිතාවයක් නොමැති වීම, සංචාරක කර්මාන්තය සඳහා ආයෝජන දිරිගැන්වීම් අවම වීම, ඉඩම් අයිතිය සඳහා ප්‍රවේශය සංකීර්ණ වීම)
5. නිපුණතා හා කුසලතා සීමිත වීම (සංචාරක අධ්‍යාපනය දැඩි ලෙස මධ්‍යගත වී පැවතීම සහ විෂය මාලාවන් හි අසමානතා පැවතිම)
6. සම්බන්ධතා ප්‍රමාණවත් නොමැති වීම (විභවතාවයක් සහිත නැඟී එන වෙළඳපොළ වෙත ඍජු ජාත්‍යන්තර ගුවන් ගමන් නොමැතිකම, දුර්වල ප්‍රවාහන මාර්ග ජාලය සහ අභ්‍යන්තර සම්බන්ධතා දුර්වල වීම හා නවීන ස්වයංක්‍රීය පද්ධති නොමැතිකම)

ශ්‍රී ලංකාව සුවිශේෂී ස්ථානයක පිහිටීම හේතුවෙන් (යුරෝපය, ආසියාව සහ මැදපෙරදිග මධ්‍යයේ) පවත්නා ඉඩ ප්‍රස්ථා සමඟ නව නිෂ්පාදන සංවර්ධනය සම්බන්ධයෙන් (පශ්චාත් වසංගත ඉඩ ප්‍රස්ථාවක් ලෙස සුවතා සංචාරක කර්මාන්තය) ඉහත දුර්වලතා මඟහැරීම සඳහා ගනු ලබන විසඳුම් ක්‍රියාමාර්ග එකවර සිදු කළ හැකි ය. තවද, ජාත්‍යන්තර වශයෙන් නැගී එන ප්‍රවණතා සංචාරක ගමනාන්ත සැලසුම්කරණ සහ අලෙවිකරණ ක්‍රියාවලියට ඵලදායී ලෙස ඇතුළත් කළ යුතුය.

සංචාරක කර්මාන්තය දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා කුමන ප්‍රතිපත්ති හා උපාය මාර්ග සලකා බැලිය යුතුද යන්න තක්සේරු කිරීමේ දී, සංචාරක වත්කම්වල ශක්තිය, ගමනාන්තයේ වැදගත්කම, කීර්තිය මෙන්ම ජාත්‍යන්තර සංචාරක ක්ෂේත්‍රයට විශේෂිත වූ ගැටළු සහ අභියෝග ද සලකිල්ලට ගත යුතුය. සංචාරක කර්මාන්තයේ අනාගත සංවර්ධනයට සහ තිරසර පැවැත්මට සමහර කරුණු තර්ජනයක් විය හැකිය.

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ දියුණුව සඳහා සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් පිළිබඳ ව (UNESCO ලෝක උරුම ස්ථාන 8 ක් පිහිටා තිබීම) පොහොසත් භාවය හා විවිධත්වය මෙන් ම කිලෝමීටර් 1,585 ක් වූ වෙරළ තීරය හා අගනා ජෛව විවිධත්වය (ගෝලීය ආකර්ෂණීය ස්ථාන 36 න් එකක් වීම) යනාදී සාධක කෙරෙහි ද විශ්වාසය තැබිය හැකි ය. සංචාරක ආකර්ෂණීය ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව වඩාත් ප්‍රසිද්ධියට පත්වන්නේ මෙම අද්විතීය ස්වභාවික සම්පත් හා සංස්කෘතික උරුමයන් නිසාය. ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ ප්‍රධාන ගුවන් හා මුහුදු මාර්ග මධ්‍යයෙහි වූ මූලෝපායික පිහිටීම නිසා මෙන්ම ගෝලීය සැපයුම් මධ්‍යස්ථානයක් ලෙස අප රට ස්ථානගත කිරීමට මෙමඟින් සුවිශේෂී වාසියක් හිමි වී ඇත. උසස් තත්ත්වයේ සංචාරක අත්දැකීමක් අපේක්ෂා කරන, වර්ධනය වෙමින් පවතින මධ්‍යම පාන්තික වෙළඳපොළක් ලෙස සහ බිලියන තුනකට අධික ජනතාවක් වාසය කරන ඉන්දියානු උප මහද්වීපය අබියස ශ්‍රී ලංකාව පිහිටා ඇති බැවින් සංචාරක කර්මාන්තයේ වර්ධනයට ඉතා හිතකර පරිසරයක් නිර්මාණය වී ඇත.

සංචාරක කර්මාන්තයේ විභවයන් කරා ළඟාවීමට ඇති බාධාකාරී තර්ජන හඳුනා ගැනීම තුළින්, වඩාත් යෝග්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කළ හැකි ය. ශ්‍රී ලංකාවේ ස්වාභාවික පරිසරය සහ සම්පත් ප්‍රධාන ආකර්ෂණ ස්ථාන වලින් එකක් වන අතර, ඒවාට බලපාන අභ්‍යන්තර (ජෛව විවිධත්වය නැති වීමට තුඩු දෙන දුර්වල සැලසුම්) සහ බාහිර (දේශගුණික විපර්යාස) තර්ජන හඳුනා ගත හැකි වේ. සංචාරක කර්මාන්තයේ ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා එහි විභවය අවබෝධ කර ගැනීමට සුදුසුකම් ලත් ශ්‍රම බලකායක් අවශ්‍ය වේ. එනමුත්, ශ්‍රී ලංකාවේ පුහුණු ශ්‍රම බලකායෙන් කාන්තාවන් සත්කාරක අංශයේ සේවය කිරීමට දක්වන්නේ අඩු උනන්දුවකි. නිපුණතාවයක් සහිත වෘත්තියක් ලෙස සංචාරක කර්මාන්තයේ නියැලීමට තරුණයින් අතර උනන්දුවක් නොමැති වීමට හා දැඩි ලෙස බාධා කෙරෙන කම්කරු නීති පැවතීමද දුෂ්කර වෘත්තීය පරිසරයක් නිර්මාණය කිරීමට හේතු වී ඇත. කොවිඩ්-19 වසංගතය, පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය සහ මෑත කාලීන ව මුහුණදුන් ආර්ථික, දේශපාලන අස්ථාවරත්වය සහ ආරක්ෂාව අඩු මට්ටමක පැවතීම හේතුවෙන් සංචාරක කර්මාන්තය සංවර්ධනය සහ පෝෂණය කිරීම සඳහා සුදුසු දේශපාලනික සහ ආර්ථික පරිසරයක් නොමැති වීම බාධාවක් ලෙස දක්වා ඇත.

ඉහත දක්වා ඇති අභියෝග ජය ගැනීම සඳහා ජාතික සහ පළාත් මට්ටමින් සියලු අමාත්‍යාංශ, සංවිධාන සහ අදාළ පාර්ශවකරුවන් සම්බන්ධ කර ගනිමින්, ඉහළ නිපුණතාවයකින් හෙබි සහභාගීත්ව ක්‍රියාවලියක් මගින් සංචාරක කර්මාන්තය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය සකස් කරන ලදී. ශ්‍රී ලංකාවේ සංස්කෘතික හා ස්වාභාවික පරිසරය පිළිබඳ සෘණාත්මක බලපෑමක් ඇති විය හැකි තීරණාත්මක ගැටළු විසඳීම මගින් සමස්ථ ආර්ථිකයේ වර්ධන ඉලක්ක සපුරා ගැනීම කෙරෙහි මෙම සංචාරක ප්‍රතිපත්ති ක්‍රියාවලිය මගින් අවධානය යොමු කර ඇත.

## 07. ප්‍රතිපත්ති අභිමතාර්ථ

ශ්‍රී ලංකාව 'මතකයේ රැඳෙන, අව්‍යාජ සහ විවිධ අත්දැකීම් සඳහා ලොව විශිෂ්ටතම දිවයින' බවට පත් කිරීමේ දැක්ම අනුව, පළමු වසර පහ තුළ පහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීමට බලාපොරොත්තු වේ. ඉන් පසුව වෙනස් වන සමාජ-ආර්ථික තත්වයන් සහ කර්මාන්තයේ ගතිකතාවන් හා ප්‍රවණතා සලකා බැලීම තුළින් ඉදිරි වසර පහ සඳහා ප්‍රතිපත්ති අභිමතාර්ථ සංශෝධනය කරනු ලැබේ. තවද, සංචාරක ප්‍රතිපත්තියේ අභිමතාර්ථ මගින් රටෙහි ආර්ථික වර්ධනය සහ තිරසර සංචාරක සංවර්ධනය සහතික කිරීම කෙරෙහි ද අවධානය යොමු කර ඇත.

1. තිරසර සංවර්ධන ඉලක්ක (SDGs) සාක්ෂාත් කරගැනීම සඳහා තිරසර, දේශගුණික සහ සමාජ-ආර්ථික තත්වයන්ට ඔරොත්තු දෙන අඛන්ඩ ආර්ථික වර්ධනයක් ඇති කිරීම සහ වගකිව යුතු ජාත්‍යන්තර සංචාරකයින් සහ ආයෝජකයින් මෙරටට ආකර්ෂණය කර ගැනීම.

2. ජාතික සහ උප-ජාතික මට්ටම් අතර මෙන්ව රාජ්‍ය සහ පෞද්ගලික පාර්ශවකරුවන් අතර මනා සම්බන්ධීකරණය, හවුල්කාරිත්වය, ඒකාබද්ධ වීම හෝ සහයෝගීතාව වැඩිදියුණු කිරීම තුළින් සංචාරක අංශයේ ඵලදායී පාලනයක් ඇති කිරීම.

3. දේශීය සම්පත්, සංස්කෘතිය සහ පරිසරය භාවිතා කිරීම සහ ආරක්ෂා කිරීම මගින් සියලුම පාර්ශ්වකරුවන්ට සහ පුරවැසියන්ට ප්‍රතිලාභ අත්කර දෙන ජනතා කේන්ද්‍රීය කර්මාන්තයක් ඇති කිරීම.

4. සියලු ම දේශීය හා විදේශීය සංචාරක මෙහෙයවන්නන් විධිමත් පරිදි ලියාපදිංචි කිරීම සහ ඔවුන් නීත්‍යානුකූලව මෙහෙයුම් කටයුතු සිදු කරමින් සංචාරක ආදායම් පිළිබඳව වගවන සහ විනිවිදභාවයෙන් කටයුතු කිරීම සහතික කිරීම.

5. සුළු, මධ්‍ය සහ මහා පරිමාණ ව්‍යාපාර සහ නව ක්ෂුද්‍ර සංචාරක නිෂ්පාදන සහ සේවා සඳහා ආශ්‍රිත දිරිගැන්වීම් ඇති කිරීම සහ සංචාරක අංශයේ ව්‍යවසායකත්වය, නවෝත්පාදන සහ ඩිජිටල්කරණය පෝෂණය කරන කර්මාන්තයක් ඇති කිරීම.

6. නව දේශීය වෙළඳපොළවල්, තිරසර නිෂ්පාදන සංවර්ධනය කිරීම සහ වගකිව යුතු දේශීය සංචාරක කර්මාන්තයක් උපායමාර්ගිකව ප්‍රවර්ධනය කිරීම.

## 08. ජාතික සංචාරක ප්‍රතිපත්තියේ ප්‍රධාන තේමා

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා තරඟකාරීත්වයෙන් සහ සහයෝගයෙන් ක්‍රියා කල යුතුය. ඒ සඳහා සංචාරක අමාත්‍යාංශය හා අනෙකුත් රේඛීය අමාත්‍යාංශ, පළාත්සභා සහ පළාත් පාලන ආයතන සමඟ සම්බන්ධ කිරීම සඳහා ප්‍රධාන මෙහෙයුම් තේමා 04 ක් යටතේ සවිස්තරාත්මක උපාය මාර්ගික ප්‍රතිපත්ති රාමුවක් මෙම සංචාරක ප්‍රතිපත්තිය මඟින් යෝජනා කර ඇත. සංචාරක කර්මාන්තයේ සාර්ථකත්වය උදෙසා සියලුම පාර්ශ්වකරුවන් සමග සමීප සහයෝගීතාවය පවත්වා ගනිමින් ඔවුන්ගේ හවුල්කාරිත්වයෙන් සමස්ත රාජ්‍ය ප්‍රවේශයක් ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත් වේ. ඉහත දක්වන ලද ප්‍රතිපත්ති අභිමතාර්ථ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පහත සඳහන් ප්‍රධාන මෙහෙයුම් ප්‍රතිපත්ති තේමා හතර සහ ඒ ආශ්‍රිත උපාය මාර්ග යටතේ විස්තර කර ඇත.

**1 වගුව - ප්‍රධාන ප්‍රතිපත්ති තේමා සහ ආශ්‍රිත උපාය මාර්ග සංකලනය (පරිවර්තනීය වෙනස්කම් සිදු කරනු ලබන ක්‍රියාකරුවන්)**

| ඒකාබද්ධ පාලනය | සංඝෘහිත ආර්ථික වර්ධනය සහ තිරසර සංචාරක සංවර්ධනය | වැඩි දියුණු කළ සේවා ප්‍රමිති, ඵලදායි සම්බන්ධතා සහ දැනුවත් කරන ලද පාර්ශවකරුවන් | නව ගමනාන්ත සංවර්ධනය, සංචාරක කර්මාන්තය ඔරොත්තු දෙන අයුරින් ගොඩනැගීම සහ දිරිගැන්වීමේ උපාය මාර්ග |
|---|---|---|---|
| -සංචාරක අංශයේ සාර්ව පාලනය ප්‍රතිසංස්කරණය කිරීම.<br><br>-සංචාරක අංශයේ අතරමැදි පාලනය ප්‍රතිව්‍යුහගත කිරීම<br><br>- රාජ්‍ය ආයතන ඵලදායී අයුරින් ප්‍රතිව්‍යුහගත කිරීම<br><br>-අර්බුද කළමනාකරණ පද්ධතිය සහ සමාජ ආරක්ෂණ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම<br><br>-පුද්ගලික අංශයේ නියෝජනය සහ සංචාරක අංශයේ කාර්යභාරය නැවත පෙළ ගැස්වීම. | -තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම පිණිස සංචාරක කර්මාන්තයේ නියාමන රාමු සුසංයෝග කිරීම<br><br>-ස්වාභාවික, සංස්කෘතික සහ අනෙකුත් සංචාරක වත්කම් තිරසර අන්දමින් භාවිතා කිරීම සහ සංරක්ෂණය කිරීම<br><br>- සංචාරක ප්‍රතිලාභ සාධාරණ ලෙස බෙදා හැරීම ඉහළ නංවමින් පුද්ගල කේන්ද්‍රීය හා දේශීය සම්පත් මත පදනම් වූ සංවර්ධනය උදෙසා නිෂ්පාදන සහ සේවා සඳහා මඟ පෙන්වන ප්‍රමිති සහ ආචාර ධර්ම සංවර්ධනය කිරීම<br><br>-තිරසරභාවය සහතික කිරීම සඳහා නියාමන රාමුවක් සහ ගෝලීයව පිළිගත් ප්‍රමිති සංවර්ධනය කිරීම<br><br>-සංචාරක කර්මාන්තයේ ආයෝජන සහ සංවර්ධනය සඳහා හිතකර ව්‍යාපාරික පරිසරයක් සහතික කිරීම | - දත්ත එක්රැස් කිරීම, දත්ත විශ්ලේෂණය කිරීම සහ විස්තීර්ණ තොරතුරු කළමනාකරණ ක්‍රියාවලියක් සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීම<br><br>-සංචාරක අංශයේ සංවර්ධනය සඳහා වන ජාතික උපාය මාර්ග සමාලෝචනය කිරීම<br><br>-අලෙවිකරණ දර්ශනය නැවත උපාය මාර්ගික ව සකස් කිරීම<br><br>- සංචාරක කර්මාන්තයේ සම්බන්ධතා නවීන තාක්ෂණය හරහා වැඩිදියුණු කිරීම.<br><br>-දේශීය සම්පත් භාවිතා කරමින් සංචාරක ගමනාන්තය සඳහා නිපුණතා වැඩි දියුණු කිරීම. | -ශ්‍රී ලංකාවේ ස්වාභාවික හා සමාජ සංස්කෘතික උරුමයන්හි ආකර්ෂණය තුළින් නව සංචාරක ගමනාන්ත සහ නිෂ්පාදන සංවර්ධනය කිරීම<br><br>-ව්‍යාපාරික පරිසරය තරඟකාරී ලෙස ස්ථානගත කිරීම සහ වැඩිදියුණු කිරීම<br><br>-තිරසර සහ වගකීම් සහිත සංචාරක සංවර්ධනයක් සඳහා දිරිගැන්වීම් සිදු කිරීම<br><br>-සංචාරකයින්ගේ සුරක්ෂිතභාවය සහ සෞඛ්‍ය ආරක්ෂාව වැඩි දියුණු වන ලෙස සංචාරකයින්ගේ අත්දැකීම් පරිවර්තනය කිරීම<br><br>-වෙළඳපළ පිළිබඳ දැනුවත්භාවය සහ පර්යේෂණ අවස්ථා වැඩිදියුණු කිරීම. |

මෙම ප්‍රතිපත්තියේ අරමුණ වන්නේ සංචාරක ක්ෂේත්‍රයේ උපාය මාර්ගික වෙනස්කම් සිදු කිරීම සඳහා ඉඩ ප්‍රස්ථා රාශියක් ඇති කිරීමයි. සංචාරක ක්ෂේත්‍රයේ කාර්යක්ෂම පාලනය තුළින් ඵලදායීතාවය ඉහළ නැංවීම, තරඟකාරී වැටුප් ව්‍යුහයක් ඇති කිරීම, නව ප්‍රවර්ධන උපාය මාර්ග, නව සංචාරක නිෂ්පාදන සහ වෙළඳපොලවල්, දේශගුණය සහ ස්වභාව සෞන්දර්ය පාදක කරගත් තිරසර සංවර්ධනය, සම්බන්ධතා ඉහළ නැංවීම සහ පුද්ගලික අංශයේ ඵලදායී විනිවිදභාවයෙන් යුත් සහභාගීත්වයක් යනාදිය මෙයට ඇතුළත් වේ. එමගින් සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාවේ තරඟකාරිත්වය ඉහළ නංවන අතර එහි සංස්කෘතික හා ස්වාභාවික වටිනාකම් ද ආරක්ෂා කෙරෙනු ඇත.

මෙම ප්‍රතිපත්තිය මඟින් සංචාරක කර්මාන්තය සමඟ පෙළ ගැසිය යුතු ආංශික ප්‍රමුඛතා, ප්‍රතිපත්ති මූලධර්ම සහ ප්‍රතිපත්ති ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය අනෙකුත් අදාළ ජාතික ආංශික ප්‍රතිපත්තියකටම අන්තර්ග්‍රහණය කර පෙළගැස්වීම සඳහා අවශ්‍ය දිශානතිය සහ මඟ පෙන්වීම මෙම සංචාරක ප්‍රතිපත්තිය සිදු කර ඇත.

## 09. ජාතික සංචාරක ප්‍රතිපත්තිය සඳහා මූලධර්ම

ශ්‍රී ලංකාවේ සංචාරක ප්‍රතිපත්තිය මඟින් සංචාරක ක්ෂේත්‍රයේ තාක්ෂණික දියුණුව මෙන්ම අප රටට ආවේනික වූ පාරිසරික, දේශගුණික, සමාජ-ආර්ථික සහ සංස්කෘතික වටිනාකම් අතර පරිපූර්ණ සමතුලිතතාවයක් පවත්වා ගැනීම සහතික කර ඇත. ශ්‍රී ලංකාවේ අද්විතීය අනන්‍යතාවය ආරක්ෂා කර ගනිමින්, ප්‍රතිපත්ති මූලධර්ම වලට අනුගත වීම අතිශයින් වැදගත් වන අතර, එය ප්‍රතිපත්තියේ අනුකූලතාවය ළඟා කර ගැනීමට ද උපකාරී වනු ඇත. ශ්‍රී ලංකාව නිවර්තන කලාපීය දේශගුණික රටාවන්ට අයත් සංවර්ධනය වෙමින් පවතින දූපත් රාජ්‍යයක් වන බැවින් නිරන්තර දේශගුණික විපර්යාස හා බලපෑම් වලට බෙහෙවින් ලක් වේ. එබැවින්, තිරසර පරිභෝජන නිෂ්පාදනයන් සහ තිරසර අන්දමින් අපද්‍රව්‍ය බැහැර කිරීම කළමනාකරණය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර, පරිසරයට සිදුවන අහිතකර බලපෑම් අවම කරගැනීම සඳහා එම මූලධර්ම වලින්ම සංචාරක කර්මාන්තයට මඟ පෙන්වීම සිදු කළ යුතුය.

## 10. ප්‍රධාන තේමා සඳහා ප්‍රතිපත්ති ප්‍රකාශන

පහත සඳහන් ප්‍රතිපත්ති ප්‍රකාශන මගින් එම ප්‍රතිපත්තියේ ප්‍රතිපත්ති මැදිහත්වීම්, උපාය මාර්ගික ක්ෂේත්‍ර යටතේ හඳුනා ගෙන ඇති දැක්ම සහ අභිමතාර්ථ සපුරා ගැනීම අපේක්ෂා කෙරේ. මෙම ප්‍රතිපත්තිය මඟින් සංචාරක කර්මාන්තයේ සංග්‍රහිත ආර්ථික වර්ධනය සහ තිරසර සංචාරක සංවර්ධනය සහතික කිරීම සඳහා සැපයුම් අංශයේ මෙන්ම සංචාරක නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුමෙහි ද අවශ්‍ය වෙනස්කම් කිරීම සිදු කරයි.

### 10.1. ඒකාබද්ධ පාලනය

ඒකාබද්ධ ජාතික සංචාරක ප්‍රතිපත්ති මූලධර්ම හා ක්‍රියාමාර්ග තුළින් තිරසර සංචාරක සංවර්ධනය සාක්ෂාත්කර ගැනීම සහතික කළ යුතුය. ඒ සඳහා සංචාරක වත්කම් වල ධාරිතාව තක්සේරු කිරීම්, අගය දාම විශ්ලේෂණය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය අධ්‍යයන සිදු කිරීම වැනි සාක්ෂි මත පදනම් වූ දේශීය සැලසුම් ක්‍රම සැලකිල්ලට ගනිමින්, සිරස් සහ තිරස් ප්‍රතිපත්ති මූලධර්ම ඒකාබද්ධ කිරීමක් තුළින් ආයතනික ප්‍රතිසංස්කරණ, පුද්ගලික අංශයේ හා සිවිල් සමාජ සහභාගීත්වය වැඩි දියුණු කිරීම අවශ්‍ය වේ.

| **ප්‍රතිපත්ති ප්‍රකාශනය:** |
| --- |
| තරඟකාරී සංචාරක නිෂ්පාදන සහ අමතක නොවන අත්දැකීම් ලබා දීම සඳහා සංචාරක කර්මාන්තයේ සංවර්ධනයට සෘජුව හෝ වක්‍රව සම්බන්ධ වන රජයේ නියෝජිතායතන වල සහ පළාත් පාලන ආයතනවල පාලන හැකියාව සහතික කිරීම සඳහා අන්තර්-රාජ්‍ය සහයෝගිතාව සහ සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම. |

## 10.2 සංගෘහිත ආර්ථික වර්ධනය සහ තිරසර සංචාරක සංවර්ධනය

ජාතික සංචාරක ප්‍රතිපත්තිය මගින් සංචාරක ගමනාන්ත තිරසරව කළමනාකරණය කිරීම සහ පාරිසරික හිතකාමී පරිචයන් හා සමාජ ආරක්ෂණ ක්‍රම වඩාත් පුළුල් අන්දමින් අනුගමනය කිරීම දැඩි ලෙස නිර්දේශ කර ඇත. ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රයේ දිගු කාලීන ශක්‍යතාව සඳහා අත්‍යවශ්‍ය වන ස්වාභාවික, සංස්කෘතික සහ පාරිසරික සම්පත් සංරක්ෂණය උදෙසා තිරසර සංචාරක කර්මාන්තයක් අත්‍යවශ්‍ය වේ. මීට අමතරව, පුනර්ජනනීය බලශක්ති භාවිතය, ප්‍රතිචක්‍රීකරණය ක්‍රියාවලිය, එක් වරක් පමණක් භාවිත කරන ප්ලාස්ටික් පරිහරනයට තිරසර ප්‍රමිති අවශ්‍යතා සහ නව සංචාරක ව්‍යාපෘති විසින් සපුරාලනු ලබන බව සහතික කිරීම සඳහා නව නිර්ණායක සකස් කළ යුතුය. සංචාරක ව්‍යාපාරයේ මූලික අවශ්‍යතාවයක් වන්නේ අදායම් අගය දාමයේ පහලින් සිටින අවදානමට ලක් විය හැකි කණ්ඩායම් සහ සේවකයින් ප්‍රවාහයට ඇතුළත් කිරීම, ඔවුන්ගේ සහභාගීත්වය සහතික කිරීම සහ දරිද්‍රතාවයෙන් පෙලෙන ප්‍රජාව වෙත ප්‍රතිලාභ ගලා ඒම සහතික කිරීමයි. එමගින් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ 2030 වර්ෂය සඳහා වූ තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමටද අපේක්ෂා කර ඇත.

| ප්‍රතිපත්ති ප්‍රකාශනය: |
|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් තිරසර සංවර්ධන ඉලක්ක සහ ක්‍රියාමාර්ග වලට අනුගත වෙමින් (UN-SDGs) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ තිරසර සංවර්ධනය සඳහා සුදුසු මිණුම් සහ ප්‍රමිති සපයා ඇත. ඒ අනුව, රටේ සෞභාග්‍ය සහතික කරමින් ආර්ථික සංවර්ධනය සහ වර්ධනය කරා මෙහෙයවන ගමනේදී වෙළඳපළ තරගකාරීත්වය සහ ඉහළ වටිනාකමක් සහිත නව්‍යකරණ නිෂ්පාදන සහ සේවා සැලකිල්ලට ගනිමින් වගවීම් සහිත තිරසර පරිභෝජන පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම සංචාරක කර්මාන්තයේ කාර්යභාරය වේ. |

## 10.3 වැඩි දියුණු කළ සේවා ප්‍රමිති, ඵලදායි සම්බන්ධතා සහ දැනුවත් කරන ලද පාර්ශවකරුවන්

ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය ඩිජිටල් අවකාශ සහ සාක්ෂි පදනම් කරගත් පර්යේෂණවල සහාය ඇතිව විවිධාංගීකරණය කළ යුතු ය. සංචාරක අංශයේ සංවර්ධනය සැලසුම් කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා මේ සම්බන්ධ දත්ත සහ තොරතුරු ඉතා වැදගත් වේ. සංචාරක වත්කම් කළමනාකරණය වැඩිදියුණු කිරීමේ දී සංචාරක කර්මාන්තය ආශ්‍රිත ක්ෂේත්‍ර ඇගයීම සඳහා වඩා හොඳ ක්‍රියා පිළිවෙළක් අවශ්‍ය වේ. වත්මන් පිළිවෙත් ප්‍රතිසංස්කරණය කිරීම, සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම මඟින් ගමනාන්තයේ තරගකාරිත්වය ඉහළ නැංවීමට පහසුකම් හා ඉඩ ප්‍රස්ථා සලස්වනු ලැබේ.

ඩිජිටල්කරණය සහ නවෝත්පාදනය මගින් සංචාරක කර්මාන්තයේ වඩාත් වැදගත් සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරයි. ශ්‍රී ලංකා ආර්ථිකයේ අන්තර්ජාලය භාවිතා කරන ප්‍රධාන ක්‍රියාකරුවන්ගෙන් සමන්විත අන්තර් සහ බහුවිධ සම්බන්ධතා ඇති සංචාරක කර්මාන්තයට වෙබ් අඩවි පාදක යෙදුම් හා සමාජ මාධ්‍ය වැනි නවීන තාක්ෂණය හරහා සහයෝගය ලබා දිය යුතුය. සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධන කටයුතු සඳහා නව නිපැයුම් සහ නවෝත්පාදන තොරතුරු ඇතුලත් නව සන්නිවේදන තාක්ෂණය නව්‍ය අන්දමින් භාවිතා කිරීම කළ යුතුය. සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය උදෙසා ප්‍රධාන ප්‍රවණතා සම්බන්ධයෙන් සාක්ෂි සැපයීමක් මෙමඟින් අපේක්ෂා කෙරේ.

| ප්‍රතිපත්ති ප්‍රකාශනය: |
|---|
| සංචාරක කර්මාන්තයේ ආරක්ෂාව තහවුරු කරන දේශීය නවෝත්පාදන අවකාශ සඳහා යටිතල පහසුකම් පුළුල් කරමින් නවෝත්පාදන ධාරිතාව වැඩි කිරීම සඳහා නව තාක්ෂණය මත පදනම් වූ ආයෝජන සඳහා පහසුකම් සැලසීම පිණිස සංචාරක කර්මාන්තය ඩිජිටල් පරිවර්තනයකට යොමු කිරීම සහතික කිරීම. |

## 10.4 නව ගමනාන්ත සංවර්ධනය, සංචාරක කර්මාන්තය ඔරොත්තු දෙන අයුරින් ගොඩනැගීම සහ දිරිගැන්වීමේ උපාය මාර්ග (වෙළඳපොළ පරිසරය නැවත ස්ථානගත කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම)

සංචාරකයෙකු යම් ගමනාන්තයකට ආකර්ෂණය කර ගැනීමේ තීරණාත්මක සාධක වන්නේ එම රටෙහි ජාතික උරුමය, සංස්කෘතිය, ස්වභාවික සෞන්දර්යය සහ සමාජ වටිනාකම් යනාදියයි. තවද, මෙම සාධක සෘජුව සහ වක්‍රව ආර්ථික වර්ධනයට මෙන්ම සමාජ සංවර්ධනයට ද දායක වේ. ඒ අනුව, ශ්‍රී ලංකාවේ අද්විතීය සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් ප්‍රවර්ධනය කිරීම සඳහා සැලසුම් සකස් කිරීම සහ ඒවාට වටිනාකම් හා අගය එකතු කරමින් සංචාරක කර්මාන්තය විවිධාංගීකරණය කිරීම මෙහි අරමුණ වේ.

ගෝලීය වශයෙන් වර්ධනය වන ඉහළ ආදායම් සහිත සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම පිණිස සංචාරක ඉල්ලුම මගින් වාසි ලබා ගැනීම, ක්ෂුද්‍ර සංචාරක ආකෘතියක් ලෙස පාරිභෝගික අවශ්‍යතාව අනුව සැලසුම් කරනු ලබන සංචාරවල අවශ්‍යතා සහ ගමනාන්ත කිහිපයක වැඩිපුර ගත කිරීම ආකර්ෂණය කර ගැනීම අත්‍යවශ්‍ය සාධක වේ. මේ සම්බන්ධයෙන්, ව්‍යාපාර ආයෝජන සහ සංචාරක සත්කාරය යන අංශ අඛණ්ඩව මූල්‍ය සහය ලබා ගැනීම තුළින් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ තිරසර සංවර්ධනය සහතික කල හැක. ඒ සඳහා සංචාරක අංශයේ සැපයුම සහ ඉල්ලුම යන අංශයන් වර්ධනයට පහසුකම් සැලසීම මගින් එහි උප අංශ නියාමනය සහ සංචාරකයින්ගේ ආරක්ෂාව සැලසීම සහතික වන බව තහවුරු කිරීම අවශ්‍ය වේ.

| **ප්‍රතිපත්ති ප්‍රකාශනය:** |
|---|
| පාරිභෝගික අවශ්‍යතාව හා අභිරුචිය අනුව සැලසුම් කරනු ලබන විචක්ෂණශීලී සංචාර වලින් හෙබි සංචාරක අත්දැකීම් වැඩිදියුණු කරන වෙළඳපළ ප්‍රතිසංස්කරණය කිරීම තුළින් ඉහළ යන සංචාරක ඉල්ලුමෙහි නවීනත්වය සමඟ ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය නිවැරදිව ස්ථානගත කර සහතික කිරීම සහ කර්මාන්තයේ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම සහතික කිරීම. |

## 11. ජාතික සංචාරක ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම

### 11.1 උපාය මාර්ග

සංචාරක කර්මාන්තයෙන් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමේ අරමුණු ඇතිව ශ්‍රී ලංකාව ආකර්ශනීය ගමනාන්තයක් බවට පත් කිරීමේදී අවසාන ප්‍රථිඵලය සාක්ෂාත් කර ගැනීම සඳහා වසර 10 ක කාල පරිච්ඡේදයක් වෙනුවෙන් උපාය මාර්ගික සැලසුම් මෙම ප්‍රතිපත්තිය මගින් ඉදිරිපත් කර ඇත. ප්‍රතිපත්ති අභිමතාර්ථ සපුරාගැනීම සඳහා ක්‍රියාකාරකම් වලින් සමන්විත උපාය මාර්ග ද සමඟ වසර 3-5ක කාල පරිච්ඡේදයක් සඳහා වූ මධ්‍ය කාලීන උපායමාර්ගික සැලැස්මක් ක්‍රියාත්මක කිරීමද යෝජනා කර ඇත. තවද සංචාරක ක්ෂේත්‍රයේ දේශීය හා ගෝලීය තත්වයන්ද සැලකිල්ලට ගනිමින් සංචාරක ප්‍රතිපත්තියේ දිගු කාලීන දිශානතිය තුල එහි උපායමාර්ගික සැලැස්ම වරින් වර යාවත්කාලීන කර සංශෝධනය කල යුතුය.

### 11.2 වගකීම සහ අධිකාරිය

සංචාරක විෂය භාර රේඛීය අමාත්‍යාංශයට මෙම ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේ ප්‍රධාන වගකීම සහ අධිකාරිය පැවරී ඇත. මධ්‍ය කාලීන උපාය මාර්ගික සැලැස්මක් හරහා මෙම ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම පිළිබඳ වගකීම් සහ බලතල රේඛීය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සංචාරක ආයතන හතරට එනම්,

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA), ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB), ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය (SLCB) සහ ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM) යන ආයතනවලට පැවරී ඇත. මධ්‍යම රජය හා සමානව පළාත් මට්ටමින් සහ ප්‍රාදේශීය මට්ටමින් වගකීම් දරන අනෙකුත් අදාළ අමාත්‍යාංශ හා නියෝජිතායතන ප්‍රතිපත්ති අභිමතාර්ථ සපුරා ගැනීම උදෙසා එක්ව ක්‍රියා කරයි. උපායමාර්ගික සැලැස්ම මගින් එක් එක් ක්‍රියාකාරකම වෙනුවෙන් වගකිව යුතු නියමු සහ සහායක නියෝජිතායතන ද හඳුනා ගෙන ඇත.

## 11.3 අධීක්ෂණය සහ ඇගයීම

ජාතික සංචාරක ප්‍රතිපත්තියේ සඵලතාවය තක්සේරු කිරීම සඳහා සුදුසු අධීක්ෂණ සහ ඇගයීම් සැලසුම් අවශ්‍ය වේ. මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වගකීම සහ අධිකාරිය සංචාරක විෂය භාර රේඛීය අමාත්‍යාංශය සතුව පැවරී ඇති බැවින්, යම් කාල සීමාවකට පසු ප්‍රතිපත්තියේ සඵලතාවය සමාලෝචනය කිරීම සහ ප්‍රතිපත්තියට අවශ්‍ය වන අදාළ සංශෝධන සිදු කිරීම ද අමාත්‍යාංශයේ වගකීමකි. ප්‍රධාන අමාත්‍යාංශ/නියෝජිතායතන සහ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නියෝජිතයින්ගෙන් සමන්විත ස්වාධීන මෙහෙයුම් කමිටුවක් මගින් ප්‍රතිපත්තියේ සඵලතාවය තක්සේරු කිරීම පිණිස අධීක්ෂණ සහ ඇගයීම් සිදු කිරීමට කටයුතු කල යුතු වේ. තවද, සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාව සහ සඵලතාවය මැන බැලීම සඳහා අනු කමිටු හරහා අභ්‍යන්තර අධීක්ෂණ සහ ඇගයීම් පද්ධතිද තිබිය යුතුය. සංචාරක ප්‍රතිපත්තියේ සඵලතාවය සහ තත්‍ය ලෙස ක්‍රියාත්මක වීම මැන බැලීම සඳහා සුදුසු ගුණාත්මක දර්ශක ස්ථාපිත කර අනුගමනය කළ යුතුය.

**ඇමුණුම 1: පාරිභාෂික ශබ්දමාලාව**

මෙම පාරිභාෂික ශබ්දමාලාවේ අරමුණ වන්නේ මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනය භාවිතා කරන්නන්ට මෙම ප්‍රතිපත්තිය සකස් කර ඇති සන්දර්භය තුළ ඇතැම් පාරිභාෂිතයන් පිළිබඳ සාධාරණ අවබෝධයක් ලබා ගැනීමට උපකාර කිරීම ය. විවිධ සන්දර්භයන් සහ තත්වයන් තුළ එවැනි පාරිභාෂිතයන් අර්ථ නිරූපණය කිරීම වෙනස් විය හැකි බව සැලකිල්ලට ගැනීම වැදගත් ය.

**(අ) කොටස :**

**ප්‍රතිපත්ති අභිමතාර්ථ:** මූලික ප්‍රතිපත්ති මූලධර්ම අනුගමනය කිරීම සඳහා ප්‍රතිපත්තියකට 'අභිමතාර්ථ' ඇත. මෙම අභිමතාර්ථ මගින් අපේක්ෂිත ප්‍රතිඵල පරාසය හෝ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙන් සාක්ෂාත් කරගත යුතු දෙය පිළිබඳ ව විස්තර කරයි. ප්‍රතිපත්ති අභිමතාර්ථයක් යනු අපේක්ෂිත මඟපෙන්වීම් ක්‍රියාමාර්ග පිළිබඳ පුළුල් ප්‍රකාශයකි.

**ප්‍රතිපත්ති අරමුණු:** අභිමතාර්ථ සහ අරමුණු එක සමාන නැත. අරමුණු ස්ථාපිත කිරීමේ දී ''මැනීමේ හැකියාව'' සෑම විටම වැදගත් මූලධර්මයක් ලෙස සලකනු ලබයි. අරමුණු සාමාන්‍යයෙන් ''මෙහෙයුම් ඒකක" එකකට හෝ වැඩි ගණනකට සම්බන්ධ වන අතර සාමාන්‍යයෙන් "කෙටි කාලීන " වේ. මැනිය හැකි අරමුණු වලින් තොර ප්‍රතිපත්තියක් ලිවීම සම්පූර්ණයෙන්ම කළ හැක්කක් වන අතර එය රටේ අවශ්‍යතා ඉටු කරයි. ප්‍රතිපත්තියේ කල්පැවැත්ම සහතික කිරීමට අභිමතාර්ථ ප්‍රමාණවත් වේ. ප්‍රතිපත්ති අරමුණු යනු ප්‍රතිපත්තියට අනුගත වීම සඳහා කළ යුතු දේ පාඨකයාට අවබෝධ කර ගැනීමට උපකාර වන ප්‍රතිපත්තිය තුළ අඩංගු ලිඛිත මග පෙන්වීමයි. මෙම ලිඛිත මාර්ගෝපදේශය, නිශ්චිත සහ පැහැදිලි වචන වලින් හොඳින් පද නගා තිබිය යුතු ය.

**ප්‍රතිපත්ති මූලධර්ම:** ප්‍රතිපත්තියක් පැවතීමට ඇති හේතූන් වනුයේ ප්‍රතිපත්ති මූලධර්මයි. ප්‍රතිපත්තියක් පවතින්නේ අරමුණක් සඳහා වන අතර, මෙය මූලික මූලධර්ම වල ස්වරූපයෙන් ප්‍රකාශ වේ. රජය එම ප්‍රතිපත්තිය නිකුත් කරන්නේ ඇයි ද යන්න සහ එමගින් අපේක්ෂිත බලපෑම හෝ ප්‍රතිපත්තියේ ප්‍රතිඵලය කුමක් විය යුතු ද යන්න ප්‍රතිපත්ති මූලධර්ම මගින් ගෙන හැර දක්වයි. ප්‍රතිපත්ති මූල ධර්ම, ආයතනික හෝ උපාය මාර්ගික සැලසුම්වල දැක්මෙහි ප්‍රකාශනයන්ට සමාන වේ.

**ප්‍රතිපත්ති ප්‍රකාශන:** ප්‍රතිපත්ති ප්‍රකාශන යනු රජයේ ස්ථාවරය පළ කරන ප්‍රධාන ප්‍රකාශනයන් ය. ප්‍රතිපත්ති ප්‍රකාශන හරහා ප්‍රතිපත්තියේ අභිප්‍රාය සරල සහ සංක්ෂිප්ත ප්‍රකාශන ආකාරයෙන් ගෙන හැර දක්වයි. එබැවින්, ප්‍රතිපත්ති ප්‍රකාශන භාවිතා කරනුයේ යම් මාතෘකාවක් හෝ මාතෘකා පිළිබඳ ඍජු ප්‍රකාශයක් හෝ ප්‍රකාශයක් නියම කිරීම සඳහා ය. ප්‍රතිපත්ති ප්‍රකාශයන් හට නිරන්තර සංශෝධන වලට ලක් නොවන ආකාරයේ දිගුකාලීන පැවැත්මක් ඇත. ඒ සමගම, අනාගතයේ දී ඇති වන අනපේක්ෂිත තත්වයන් සඳහා හැඩ ගැසීමට හැකි වන සේ නම්‍යශීලීභාවයක් තිබීමට තරම් ඒවා සාමාන්‍ය වේ. පොදුවේ ගත් කල, ගනු ලබන ක්‍රියාමාර්ග පාලනය කිරීම හෝ මඟ පෙන්වීම සිදු කරන්නේ ප්‍රතිපත්ති ප්‍රකාශයන් මගින් ය. ප්‍රතිපත්ති ප්‍රකාශන වල සඳහන් වන්නේ කුමක් කළ යුතු ද යන්න මිස එය කුමන ආකාරයකින් කරන්නේ ද යන්න නොවේ. ප්‍රතිපත්ති මූලධර්ම සහ ප්‍රතිපත්ති ප්‍රකාශන වල ඉතා පැහැදිලි වෙනසක් ඇත. ප්‍රතිපත්ති මූලධර්ම යනු ප්‍රබල විද්‍යාත්මක සාක්ෂි හෝ දත්ත නොමැති වුවද ක්‍රියාවේ හෝ චින්තනයේ ''පදනම හෝ විශ්වාසයන්'' වේ. මෙම ප්‍රතිපත්ති මූලධර්ම ''විශ්වාසයට'' ගැනීමෙන් පසුව, ප්‍රතිපත්ති සම්පාදකයින් තමන් විසින් අනුගමනය කිරීමට කැප වන්නේ කුමක් ද යන්න ''ප්‍රකාශ'' කරයි. එබැවින්, ප්‍රතිපත්ති ප්‍රකාශන යනු ''අපට අවශ්‍ය වන්නේ මෙයයි යනුවෙන් ප්‍රේක්ෂකයන් වෙත නිවේදනය කරන පැහැදිලි පණිවිඩ'' බවට පත් වේ.

**(ආ) කොටස :**

**වික්‍රමාන්විත සංචාරක කර්මාන්තය:** විශේෂිත නිපුණතා සහ ශාරීරික වෙහෙසීමක් අවශ්‍ය විය හැකි යම් මට්ටමක අවදානමක් සහිත (සැබෑ හෝ සැබෑවක් ලෙස ප්‍රත්‍යක්ෂ වන) ගවේෂණ හෝ සංචාර ඇතුළත් සුවිශේෂී සංචාරක කර්මාන්තයකි.

**විනෝද නෞකා සංචාරක කර්මාන්තය :** නෞකාවක සියල්ල සපිරි නිවාඩුවක් ගත කිරීම ද ඇතුළුව විනෝදය හෝ ක්‍රීඩා අරමුණු සඳහා සිදු කරන චාරිකා ක්‍රමයකි.

**ප්‍රජා-පාදක සංචාරක කර්මාන්තය:** සංචාරක ගමනාන්ත වල වෙසෙන ප්‍රාදේශීය ජනතාවගේ දායකත්වයෙන් සහ සහභාගීත්වයෙන් සිදු කරන සංචාරක කර්මාන්තය.

**පාරිසරික සංචරණය:** නරඹන්නන්ගේ බලපෑම අවම කර සංරක්ෂණය ප්‍රවර්ධනය කරන සහ දේශීය ජනගහනයේ ඵලදායී ක්‍රියාකාරී සමාජ-ආර්ථික මැදිහත් වීමක් සපයන විනෝදය, අධ්‍යාපනය සහ ස්වභාව සෞන්දර්යය (සහ අතීතයේ මෙන්ම වර්තමානයේ දී ඒ හා බැඳුණු සංස්කෘතික ලක්ෂණ) අගය කිරීම පිණිස, සාපේක්ෂව නොඉඳුල් ස්වාභාවික ප්‍රදේශ වෙත පාරිසරික වගකීමක් සහිතව කරන සංචාරයන් ය.

**ඉහළ පාරිසරික ගුණාත්මකභාවය (HEQ):** ඉහළ පාරිසරික ගුණාත්මකභාවයේ සැලසුම් රාමුව සැලසුම්කරුවන්ට සහ සංවර්ධකයින්ට ඔවුන්ගේ ව්‍යාපෘති සඳහා තිරසර මූලධර්ම යොදාගැනීමට ප්‍රවේශයක් ලබා දෙයි. මෙහි අරමුණු පහත පරිදි වේ;

- දිස්ත්‍රික්කය තුළ නාගරික ගොඩනැගිලි සහ භූමි ප්‍රදේශයේ අනෙකුත් පරිමාණයන් සමඟ ගැළපීම සහ ඒකාබද්ධතාව සහතික කිරීම;
- සංවර්ධනයේදී ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීම සහ පාරිසරික හා සෞඛ්‍ය තත්ත්වය ප්‍රවර්ධනය කිරීම;
- ප්‍රාදේශීය සමාජ ජීවිතය ප්‍රවර්ධනය කිරීම සහ ආර්ථික ගතිකත්වය ශක්තිමත් කිරීම.

**සංගෘහිත සංචාරක කර්මාන්තය:** ආන්තික කණ්ඩායම් විසින් සංචාරක කර්මාන්තය හා සබැඳි සදාචාරාත්මක නිෂ්පාදනයේ හෝ පරිභෝජනයේ යෙදී සිටින සහ එහි ප්‍රතිලාභ බෙදා ගැනීමේ නිරත වන අන්දමේ පරිවර්තනීය සංචාරක කර්මාන්තයකි.

**MICE:** රැස්වීම්, දිරිගැන්වීම්, සම්මන්ත්‍රණ සහ ප්‍රදර්ශන (MICE) යනු හොඳින් සැලසුම් කර ගන්නා ලද විශාල කණ්ඩායම් ඒකරාශී කරන සංචාරක කර්මාන්තයකි. 80 දශකය තුළ විකාශනයට ලක් වූ MICE කර්මාන්තය පසුගිය වසර 40 තුළ විවිධ ස්වරූපයක් ලබා ගෙන ඇති අතර එය වර්තමානයේදී 'Destination Event Industry' ගමනාන්ත ක්‍රියා සංචාරක කර්මාන්තය ලෙස හඳුන්වනු ලබයි. ගමනාන්ත ක්‍රියා සංචාරක කර්මාන්තය යටතේ ඇති මෙම උප වගන්තියට ඇතුළත් වන්නේ;

- රැස්වීම් සහ සම්මන්ත්‍රණ සංචාරක කර්මාන්තය (රැස්වීම්, සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන, වැඩමුළු, සම්මේලන ආදිය)
- වෙළඳ සල්පිල් සහ ප්‍රදර්ශන සංචාරක කර්මාන්තය
- ව්‍යාපාරික සිදුවීම් සංචාරක කර්මාන්තය (නිෂ්පාදන එළි දැක්වීම්, ව්‍යාපාරික සංසද, ආදිය)
- පුද්ගලික සිදුවීම් සංචාරක කර්මාන්තය (ගමනාන්ත මංගල උත්සව, සැමරුම් අවස්ථා ආදිය)
- විනෝදාස්වාද සිදුවීම් සංචාරක කර්මාන්තය ( විලාසිතා අංග, ක්‍රීඩා තරගාවලි, සැණකෙළි,)
- ක්‍රීඩා ඉසව් සංචාරක කර්මාන්තය (සාක් ක්‍රීඩා, පිහිනුම්/බයිසිකල් පැදීම් දිවීමේ ඉසව්, රුවල් ඔරු පැදීමේ ඉසව් ආදිය)
- සංස්කෘතික සහ ආගමික සිදුවීම් කර්මාන්තය

**නාවික සංචාරක කර්මාන්තය:** නාවික සංචාරක කර්මාන්තයට යාත්‍රා කිරීම, යොට් පැදීම, නෞකා සංචාර සහ කිමිදීම මෙන් ම කුඩා වේග යාත්‍රා පැදවීම වැනි වෙරළබඩ ජල ක්‍රීඩා ද, බෝට්ටු සංදර්ශන, වරාය චාරිකා සහ සමුද්‍රීය උරුම ගමනාන්ත නැරඹීම වැනි සමුද්‍ර සංචාරක ක්ෂේත්‍රයේ විවිධ අංග ඇතුළත් වේ.

**වසංගතය:** වසංගතයක් යනු පාලනය කිරීමට අසීරු නව රෝගයක් ලෙස ලොව පුරා පැතිරීම" අර්ථ දැක්විය හැක.

**ප්‍රතිපත්ති සංසක්තනය/ අනුකූලතාවය :** රාජ්‍ය ප්‍රතිපත්ති කාලයත් සමඟ ස්ථායි සහ ස්ථාවර වන අතර එහි අරමුණු සාක්ෂාත් කර ගැනීමට මෙය උපකාරී වේ.

**තිරසර සංචාරක කර්මාන්තය:** තිරසර සංචාරක සංවර්ධනය සඳහා අදාළ සියලු පාර්ශවකරුවන්ගේ දැනුවත් භාවය, පුළුල් සහභාගීත්වය සහ ඒකමතික භාවය ගොඩනැගීම සහතික කිරීම සඳහා ශක්තිමත් දේශපාලන නායකත්වයක් අවශ්‍ය වේ. තිරසර සංචාරක කර්මාන්තය සාක්ෂාත් කර ගැනීම අඛණ්ඩ ක්‍රියාවලියක් වන අතර, එය නිරන්තරයෙන් අධීක්ෂණය කිරීම අවශ්‍ය වන අතර, අවශ්‍ය විටෙක වැළැක්වීමේ හෝ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග හඳුන්වා දීම අවශ්‍ය වේ.

**තිරසර සංවර්ධන ඉලක්ක (SDGs):** තිරසර සංවර්ධන ඉලක්ක යනු "සියල්ලන්ට වඩා හොඳ හා තිරසර අනාගතයක් සාක්ෂාත් කර ගැනීම සඳහා සැලැස්මක්" ලෙස නිර්මාණය කර ඇති අන්තර් සම්බන්ධිත ගෝලීය ඉලක්ක 17 ක එකතුවකි. තිරසර සංවර්ධන ඉලක්ක 2015 දී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සකස් කරන ලද අතර, 2030 වසර වන විට එය සාක්ෂාත් කර ගැනීමට අදහස් කෙරේ.

**සංචාරකයා:** ආගන්තුකයෙකු (ගෘහස්ථ, පැමිණෙන හෝ පිටතට යන) ඔහුගේ/ ඇයගේ සංචාරයට රාත්‍රිය ගත කිරීම ඇතුළත් නම්, සංචාරකයෙකු ( රාත්‍රිය ගත කරන ආගන්තුකයෙකු) ලෙස ද, එසේ නොවේ නම්, අමුත්තෙකු විනෝද චාරිකාකරුවෙකු ලෙස වර්ගීකරණය කර ඇත.

**අමුත්තා:** අමුත්තෙක් යනු සංචාරය කළ රට හෝ ස්ථානය නේවාසික ස්ථානයක් විසින් සේවයේ යෙදවීම යන්න හැර වෙනත් ඕනෑම ප්‍රධාන අරමුණක් සඳහා (ව්‍යාපාර, විවේකය හෝ වෙනත් පුද්ගලික අරමුණක් සඳහා ) වසරකට අඩු කාලයක් ඔහුගේ / ඇයගේ සුපුරුදු පරිසරයෙන් බාහිර ප්‍රධාන ගමනාන්තයකට සංචාරය කරන සංචාරකයෙකි. ආගන්තුකයෙකු (ගෘහස්ථ, පැමිණෙන හෝ පිටතට යන) ඔහුගේ/ ඇයගේ සංචාරයට රාත්‍රිය ගත කිරීම ඇතුළත් නම්, සංචාරකයෙකු (රාත්‍රිය ගත කරන ආගන්තුකයෙකු) ලෙස ද, එසේ නොවේ නම්, අමුත්තෙකු (හෝ විනෝද චාරිකාකරුවෙකු) ලෙස වර්ගීකරණය කර ඇත.

**පරිශීලක - උත්පාදිත අන්තර්ගතය :** පරිශීලකයින් විසින් සමාජ මාධ්‍ය වැනි මාර්ගගත සබැඳි අවකාශවල පළ කර ඇති පින්තූර, වීඩියෝ, පාඨ සහ ශ්‍රව්‍ය වැනි ඕනෑම ආකාරයක අන්තර්ගතයක්

**සුවතා සංචාරක කර්මාන්තය:** යම් තැනැත්තකුගේ පෞද්ගලික යහපැවැත්ම පවත්වා ගැනීම හෝ වැඩි දියුණු කිරීම සඳහා වූ සංචාර වේ.

**ඇමුණුම 2 : සංකේත නාම ලැයිස්තුව**

| | | |
|---|---|---|
| SDG | - | තිරසර සංවර්ධන ඉලක්ක |
| SLCB | - | ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය |
| SLITHM | - | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය |
| SLTPB | - | ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය |
| SLTDA | - | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය |

**ඇමුණුම 3 : අදාළ ප්‍රතිපත්ති සහ පනත් ලැයිස්තුව**

2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත

ජාතික සිවිල් ගුවන් සේවා ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකාවේ ජාතික දේශගුණික විපර්යාස ප්‍රතිපත්තිය

ජාතික සංස්කෘතික ප්‍රතිපත්තිය (කෙටුම්පත)

ජාතික වන සංරක්ෂණ ප්‍රතිපත්තිය

ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය

ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ප්‍රතිපත්තිය

සංචාරක අංශය සඳහා පිරිසිදු නිෂ්පාදන පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සහ උපාය මාර්ගය

ආපදා කළමනාකරණය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SME) සංවර්ධනය සඳහා වූ ජාතික ප්‍රතිපත්ති රාමුව

තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකාවේ ගමනාගමනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

වන ජීවීන් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

ඇමුණුම 4: ප්‍රධාන ප්‍රතිපත්ති තේමා හා උපාය මාර්ග

**වගු අංක- 2 :ප්‍රධාන ප්‍රතිපත්ති තේමා සහ ඒ ආශ්‍රිත උපාය මාර්ග විශ්ලේෂණය (පරිවර්තනීය වෙනස්කම් සිදු කරනු ලබන)**

| ඒකාබද්ධ පාලනය | සංගෘහිත ආර්ථික වර්ධනය සහ තිරසර සංචාරක සංවර්ධනය | වැඩි දියුණු කළ සේවා ප්‍රමිති, ඵලදායි සම්බන්ධතා සහ දැනුවත් කරන ලද පාර්ශවකරුවන් | නව ගමනාන්ත සංවර්ධනය, සංචාරක කර්මාන්තය ඔරොත්තු දෙන අයුරින් ගොඩනැගීම සහ දිරිගැන්වීමේ උපාය මාර්ග |
|---|---|---|---|
| -සංචාරක අංශයේ සාර්ව පාලනය ප්‍රතිසංස්කරණය කිරීම.<br><br>-සංචාරක අංශයේ අතරමැදි පාලනය ප්‍රතිව්‍යුහගත කිරීම<br><br>- රාජ්‍ය ආයතන ඵලදායි අයුරින් ප්‍රතිව්‍යුහගත කිරීම<br><br>-අර්බුද කළමනාකරණ පද්ධතිය සහ සමාජ ආරක්ෂණ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම<br><br>-පුද්ගලික අංශයේ නියෝජනය සහ සංචාරක අංශයේ කාර්යභාරය නැවත පෙළ ගැස්වීම. | -තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම පිණිස සංචාරක කර්මාන්තයේ නියාමන රාමු සුසංයෝග කිරීම<br><br>-ස්වාභාවික, සංස්කෘතික සහ අනෙකුත් සංචාරක වත්කම් තිරසර අන්දමින් භාවිතා කිරීම සහ සංරක්ෂණය කිරීම<br><br>- සංචාරක ප්‍රතිලාභ සාධාරණ ලෙස බෙදා හැරීම ඉහළ නංවමින් පුද්ගල කේන්ද්‍රීය හා දේශීය සම්පත් මත පදනම් වූ සංවර්ධනය උදෙසා නිෂ්පාදන සහ සේවා සඳහා මඟ පෙන්වන ප්‍රමිති සහ ආචාර ධර්ම සංවර්ධනය කිරීම<br><br>-තිරසරභාවය සහතික කිරීම සඳහා නියාමන රාමුවක් සහ ගෝලීයව පිළිගත් ප්‍රමිති සංවර්ධනය කිරීම<br><br>-සංචාරක කර්මාන්තයේ ආයෝජන සහ සංවර්ධනය සඳහා හිතකර ව්‍යාපාරික පරිසරයක් සහතික කිරීම | - දත්ත එක්රැස් කිරීම, දත්ත විශ්ලේෂණය කිරීම සහ විස්තීර්ණ තොරතුරු කළමනාකරණ ක්‍රියාවලියක් සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීම<br><br>-සංචාරක අංශයේ සංවර්ධනය සඳහා වන ජාතික උපාය මාර්ග සමාලෝචනය කිරීම<br><br>- අලෙවිකරණ දර්ශනය නැවත උපාය මාර්ගික ව සකස් කිරීම<br><br>- සංචාරක කර්මාන්තයේ සම්බන්ධතා නවීන තාක්ෂණය හරහා වැඩිදියුණු කිරීම.<br><br>-දේශීය සම්පත් භාවිතා කරමින් සංචාරක ගමනාන්තය සඳහා නිපුණතා වැඩි දියුණු කිරීම. | -ශ්‍රී ලංකාවේ ස්වාභාවික හා සමාජ සංස්කෘතික උරුමයන්හි ආකර්ෂණය තුළින් නව සංචාරක ගමනාන්ත සහ නිෂ්පාදන සංවර්ධනය කිරීම<br><br>-ව්‍යාපාරික පරිසරය තරගකාරී ලෙස ස්ථානගත කිරීම සහ වැඩිදියුණු කිරීම<br><br>-තිරසර සහ වගකීම් සහිත සංචාරක සංවර්ධනයක් සඳහා දිරිගැන්වීම් සිදු කිරීම<br><br>-සංචාරකයින්ගේ සුරක්ෂිතභාවය සහ සෞඛ්‍ය ආරක්ෂාව වැඩි දියුණු වන ලෙස සංචාරකයින්ගේ අත්දැකීම් පරිවර්තනය කිරීම<br><br>-වෙළඳපළ පිළිබඳ දැනුවත්භාවය සහ පර්යේෂණ අවස්ථා වැඩිදියුණු කිරීම. |

**ප්‍රධාන තේමාව 1 - ඒකාබද්ධ පාලනය**

| **ප්‍රතිපත්ති ප්‍රකාශනය:** |
| --- |
| තරගකාරී සංචාරක නිෂ්පාදන සහ අමතක නොවන අත්දැකීම් ලබා දීම සඳහා සංචාරක කර්මාන්තයේ සංවර්ධනයට ඍජුව හෝ වක්‍රව සම්බන්ධ වන රජයේ නියෝජිත ආයතන වල සහ පළාත් පාලන ආයතනවල පාලන හැකියාව සහතික කිරීම සඳහා අන්තර්-රාජ්‍ය සහයෝගිතාව සහ සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම. |

**උපායමාර්ගය 1.1 - සංචාරක අංශයේ සාර්ව පාලනය ප්‍රතිසංස්කරණය කිරීම**

අන්තර් අමාත්‍යාංශ සංචාරක නව මෙහෙයුම් කමිටුවක් (ITSC) ජනාධිපති කාර්යාලය මගින් ස්ථාපිත කර අමාත්‍යාංශ මට්ටමින් සම්බන්ධතා ශක්තිමත් කරනු පිණිස සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධ ආයතන (උදා: වනජීවි, පුරාවිද්‍යා, සංස්කෘතික) සමඟ මෙම ප්‍රතිපත්තිය පෙළගැස්වීමට අවශ්‍ය පහසුකම් සහ සංචාරක උපාය මාර්ගික සැලසුම් ක්‍රියාත්මක කිරීමට සහාය විය යුතුය. අන්තර් අමාත්‍යාංශ සංචාරක මෙහෙයුම් කමිටුවෙහි නියෝජිතයින්ගෙන් සමන්විත තේමාත්මක කාර්ය සාධක බලකායන් (අරමුදල් භාවිතා කිරීම එලදායිතාව හා කාර්යක්ෂමතාව ඇතුළුව) පිහිටුවීම සහ එක් එක් අමාත්‍යාංශයෙන් සංචාරක කර්මාන්තය සඳහා නියෝජිතයෙකු පත් කිරීම මගින් පවත්නා ප්‍රතිපත්ති හා අණපනත් වලට අනුකූලව නව සංචාරක නිෂ්පාදනයන්ට මඟ පෙන්වන ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීම සඳහා වඩාත් ප්‍රතිචාරාත්මක සම්බන්ධකරණ පරිසරයක් නිර්මාණය වනු ඇත. එවැනි සහයෝගිතාවක් තුළින් ශ්‍රී ලංකාවේ සංචාරක දර්ශක පිළිබඳ පොදුවේ පිළිගත් නිර්වචන මාලාවක් පිළිබඳව එකඟතාවකට ද මඟ පාදනු ලබයි.

**උපායමාර්ගය 1.2 - සංචාරක අංශයේ අතරමැදි පාලනය ප්‍රතිව්‍යුහගත කිරීම**

අමාත්‍යාංශ මට්ටමින් සම්බන්ධතා ශක්තිමත් කිරීමට අමතරව මෙම ප්‍රතිපත්තිය මඟින් මධ්‍යම රජය සහ පළාත් සභා අතර සිදු කෙරෙන සම්බන්ධතා ශක්තිමත් කිරීම නිර්දේශ කර ඇත. ආයතනික රාමුව ප්‍රමිතිකරණය කිරීම සහ ජාතික-පළාත් සහයෝගිතාව සම්බන්ධයෙන් පොදු ආකෘතියක් යොදාගැනීම සහ පළාත් සභා-මධ්‍යම රජය අතර සබඳතා පැහැදිලිව නිර්වචනය කිරීම මෙහි දී ප්‍රධාන වශයෙන් දක්වා ඇත. පළාත් සංචාරක මෙහෙයුම් කමිටු (PTSC) වැනි උපායමාර්ග හරහා දේශීය ක්‍රියාකාරීන්ගේ සහභාගීත්වය සහතික කිරීම සහ සංචාරක සංවර්ධනයේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සහ ද්විකරණය වීම වැළැක්වීම සඳහා එක් එක් මට්ටම්වල භූමිකා සහ කාර්යයන් වඩා හොඳින් නිරූපණය කිරීම සිදු කළ යුතුය. පළාත් මට්ටමට බලය බෙදාහැරීමේ ක්‍රියාකාරී සැලැස්මක් ක්‍රියාත්මක කිරීම සහ සංචාරක කර්මාන්තය උදෙසා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය වර්ධනය කිරීමේ දී කඩිනම් බලය බෙදා ගැනීමක් හා පළාත් සභාවල කාර්යභාරයට සහාය වීම සඳහා නිසි සම්පත් බෙදා ගැනීමේ යන්ත්‍රණයක් උදෙසා මෙම උපායමාර්ගය මඟින් පහසුකම් සලසනු ලැබේ.

**උපායමාර්ගය 1.3 - රාජ්‍ය ආයතන එලදායී අයුරින් ප්‍රතිව්‍යුහගත කිරීම**

ජාතික සංචාරක ප්‍රතිපත්තිය මගින් ජාතික ප්‍රතිපත්ති රාමුවෙහි ඇතුළත් පොරොන්දු ක්‍රියාවට නැංවීමටත් ඉදිරි දශකය තුළ සංචාරක කර්මාන්තය ආර්ථික සංවර්ධනයේ සහ විවිධාංගීකරණයේ කේන්ද්‍රීය සාධකය බවට පත් කිරීම තුළින් සමස්ත ආර්ථිකයේම ක්‍රියාවලියකි. ශ්‍රී ලංකාවේ සංචාරක වත්කම් කළමනාකරණය කරන රාජ්‍ය ආයතනයන්හි (SLTDA, SLTPB, SLCB, SLITHM) තරඟකාරිත්වය සහ සේවා බෙදා හැරීමේ කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා ඒවායේ නෛතික තත්ත්වයෙහි වෙනසක් සිදු කිරීම අවශ්‍ය

වේ. සංචාරක කර්මාන්තයෙන් ලැබෙන ආදායම උපරිම කිරීමට අවශ්‍යතා සහ අනාගත සංචාරක වර්ධනයට සරිලන පරිදි සංචාරක ආයතනවල වර්තමාන සංයුතිය සහ නෛතික තත්ත්වය පිළිබඳ සමාලෝචනයක් සිදු කිරීම අවශ්‍ය විය හැකිය. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය කාර්යාංශය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය වැනි සමාන ආයතන "Visit Sri Lanka" වැනි තනි ආයතනයකට ඒකාබද්ධ කිරීම මඟින් මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම යනාදිය ද ප්‍රතිපත්තිය මඟින් යෝජනා කර ඇත. අවසාන වශයෙන්, විවිධ සංචාරක සංගම් නියෝජනය කිරීම සඳහා සංචාරක සම්මේලනයක් ස්ථාපිත කළ යුතු අතර එහි නියෝජිතයින්ට "Visit Sri Lanka" ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කළ හැකිය.

**උපායමාර්ගය 1.4 - අර්බුද කළමනාකරණ පද්ධතිය සහ සමාජ ආරක්ෂණ යන්ත්‍රණය ශක්තිමත් කිරීම**

ජාතික සංචාරක ප්‍රතිපත්තිය අනපේක්ෂිත සිදුවීම් ආදිය කළමනාකරණය කිරීමේ දී, රජයට එල්ල වන පීඩනය අවම කිරීම සඳහා අර්බුද කළමනාකරණ පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම නිර්දේශ කර ඇත. ශ්‍රී ලංකාව සිය අවිධිමත් සංචාරක අංශය විධිමත් කිරීමට පියවර ගන්නා විට ඒ සඳහා ප්‍රතිපත්ති රාමුවක් සැලසුම් කිරීම සහ සංචාරක අංශයේ ඔරොත්තු දීමේ ක්‍රියාමාර්ග සංවර්ධනය කිරීමද සිදු කළ යුතුය. මේ සඳහා භාවිතයට ගතහැකි මූල්‍ය ක්‍රියාමාර්ග ලෙස භාරකාර අරමුදල්, බලපෑම් අරමුදල්, හරිත මූල්‍යකරණය, හරිත සහ නිල් බැඳුම්කර යනාදිය දැක්විය හැක. මේ පිළිබඳ ව අවධානය යොමුකර, ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රය ඕනෑම අර්බුදයකට මුහුණ දීමට වඩාත් හොඳින් සන්නද්ධ කිරීම සඳහා විකල්ප තක්සේරු කිරීම සහ සාකච්ඡා කිරීම පිණිස ශක්‍යතා අධ්‍යයනයන් සිදු කිරීම සඳහා රාජ්‍ය පුද්ගලික අංශ හවුල්කාරිත්ව කාර්ය සාධක බලකායක් (PPP) අමාත්‍යාංශය විසින් පත් කළ යුතු බව ප්‍රතිපත්තිය නිර්දේශ කරයි.

**උපායමාර්ගය 1.5 - පුද්ගලික අංශයේ නියෝජනය සහ සංචාරක අංශයේ කාර්යභාරය නැවත පෙළ ගැස්වීම**

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය තිරසාරත්වයෙන් යුතුව ස්ථානගත කිරීම සහ සංවර්ධනය කරා මෙහෙය වන ගමනේදී පුද්ගලික අංශය පුරෝගාමී බලවේගය ලෙස සැලකිය යුතු කාර්යභාරයක් සහ බලපෑමක් ඇති කළ හැකිය. එබැවින්, ජාතික සංචාරක ප්‍රතිපත්තිය මඟින් සෑම අංශයකම සහ සෑම පාර්ශවකරුවකුගේම අදහස් රාජ්‍ය ආයතනවල නියෝජනය වන බව සහතික කිරීම සඳහා සියලු පෞද්ගලික පාර්ශ්වකරුවන් සංචාරක සම්මේලනයක් තුළ ඒකරාශීව සංවිධානය විය යුතු බව නිර්දේශ කරයි. මෙම නව සංචාරක සම්මේලනයේ කොටස්කරුවන් විය හැක්කේ නිසි පරිදි නියාමනය කරන ලද හෝ ලියාපදිංචි වූ සංචාරක හෝටල් කර්මාන්ත සහ සංචාරක සංගම් වලට පමණී.

**ප්‍රධාන තේමාව 2 - සංගෘහිත ආර්ථික වර්ධනය සහ තිරසර සංචාරක සංවර්ධනය**

| **ප්‍රතිපත්ති ප්‍රකාශනය:** |
| --- |
| එක්සත් ජාතීන්ගේ සංවිධානය මඟින් තිරසර සංවර්ධන ඉලක්ක සහ ක්‍රියාමාර්ග වලට අනුගත වෙමින් (UN-SDGs) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ තිරසර සංවර්ධනය සඳහා සුදුසු මිණුම් සහ ප්‍රමිති සපයා ඇත. ඒ අනුව, රටේ සෞභාග්‍ය සහතික කරමින් ආර්ථික සංවර්ධනය සහ වර්ධනය කරා මෙහෙයවන ගමනේදී වෙළඳපළ තරගකාරීත්වය සහ ඉහළ වටිනාකමක් සහිත නව්‍යකරණ නිෂ්පාදන සහ සේවා සැලකිල්ලට ගනිමින් වගවීම් සහිත තිරසර පරිභෝජන පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම සංචාරක කර්මාන්තයේ කාර්යභාරය වේ. |

**උපාය මාර්ගය 2.1 - තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම පිණිස සංචාරක කර්මාන්තයේ නියාමන රාමු සුසංයෝග කිරීම**

තිරසර සංචාරක කර්මාන්තය දිරිමත් කර සංවර්ධනය කිරීමේදී ඵලදායී අයුරින් සම්පත් කළමනාකරණය කිරීම සහ මෙහෙයවීම මූලික අවශ්‍යතාවයකි. තිරසර සංචාරක ගමනාන්ත සංවර්ධනය කරමින් ප්‍රවර්ධනය කිරීම පිණිස යටිතල පහසුකම්, සංචාරක ස්ථාන, නිෂ්පාදන සහ සේවා වලට ප්‍රවේශ වීම හා බැඳුණු කරුණු ද ඇතුළත්ව ව්‍යාපාරික පහසුකම් ගොඩනැගීම උදෙසා අවම අවශ්‍යතා සම්බන්ධයෙන් එකඟ වීමට නාගරික සංවර්ධන අධිකාරිය, පළාත් පාලන ආයතන සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය අතර සහයෝගිතාව ශක්තිමත් කිරීම ජාතික ප්‍රතිපත්තිය මඟින් නිර්දේශ කර ඇත. සංචාරක කලාප තුළ සංගෘහිත සංවර්ධනයට සහාය වීම සඳහා වන තක්සේරු කිරීම් සිදු කිරීම සහ මහජන කේන්ද්‍රීය ආර්ථික සංවර්ධනයක් සඳහා සිවිල් සමාජයේ ප්‍රබල සහභාගිත්වයක් ලබාගැනීම ඇතුළුව, පළාත් මට්ටමින් ඉහළ පාරිසරික තත්ව සැලසුම් (HEQ - සමාජ, සංස්කෘතික සහ පාරිසරික තිරසරභාවය උදෙසා) සංවර්ධනය කිරීම ආදියද මෙයට ඇතුළත් වේ.

සංචාරක කලාප ප්‍රතිව්‍යුහගත කිරීම සහ නැවත ස්ථානගත කිරීම ප්‍රධාන කාර්යයක් වන අතර ඒ සඳහා දත්ත මත පදනම්ව ධාරිතා තක්සේරු කිරීම සිදු කිරීමට නිර්දේශ කරනු ලැබේ. සංචාරක ගමනාන්ත තුළින් සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ශක්තිමත් පාරිසරික හා සමාජීය ගැටලු කළමනාකරණය කිරීම (කසල කළමනාකරණය, අපද්‍රව්‍ය කළමනාකරණය සහ පුනර්ජනනීය බලශක්ති පරිභෝජනය සඳහා වන ප්‍රතිපත්ති) සඳහා ඉල්ලුමක් පවතී.

මීට අමතරව,ජාතික සංචාරක ප්‍රතිපත්තිය මඟින් ප්‍රතිව්‍යුහගත කරන ලද සංචාරක කලාපවල වගවීම් සහිත සංචාරක ආයෝජන සඳහා ප්‍රතිපත්ති රාමු සහ ආර්ථික දිරිගැන්වීම් නිර්දේශ කර ඇත. සංචාරක ක්ෂේත්‍රය වඩාත් තිරසරව සංවර්ධනය කිරීම සඳහා දේශගුණික විපර්යාස පිළිබඳ ජාතික වශයෙන් තීරණය කරන ලද දායකත්ව (NDC) නිර්දේශ මඟින් සංචාරක ක්ෂේත්‍රයට ප්‍රතිලාභ ලබා ගත හැක. තවද, රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන්ට තම පරිභෝජන හා නිෂ්පාදන රටා සම්බන්ධයෙන් වඩාත් වගකීමෙන් යුතුව කටයුතු කිරීම සඳහා දිරිගැන්වීම් ලබා දෙනු ඇත. දේශගුණික විපර්යාස පිළිබඳ පැරිස් ගිවිසුම (2021 සංශෝධිත) අනුව ශ්‍රී ලංකාවේ ජාතික වශයෙන් තීරණය කරන ලද දායකත්වය මඟින් සංචාරක ක්ෂේත්‍රයේ දේශගුණික විපර්යාස අවම කිරීම සහ ඒ සඳහා අනුවර්තනය වීමේ පියවර පැහැදිලිව දක්වා ඇත. පුනර්ජනනීය බලශක්තිය වැඩි වශයෙන් උපයෝගී කර ගැනීම, නව්‍යකරණ සැළසුම් තුළින් තිරසර ගොඩනැගිලි ඉදි කිරීම, නිවැරදි ඍතුමය අනාවැකි පල කිරීම අනුව චාරිකා සැලසුම් කිරීම, මුහුදු ජල මට්ටම ඉහළ යාම සහ අධික උෂ්ණත්වයෙන් ආරක්ෂා වීම යනාදිය මේවාට ඇතුළත් වේ. ඉදිරියේ දී දේශගුණික විපර්යාස අවම කිරීම සඳහා ජාතික හා පළාත් සංචාරක උපාය මාර්ග හා සැලසුම්වලට එම යෝජනා ඒකාබද්ධ කළ යුතුය.

**උපායමාර්ගය 2.2 - ස්වාභාවික, සංස්කෘතික සහ අනෙකුත් සංචාරක වත්කම් තිරසර අන්දමින් භාවිතා කිරීම සහ සංරක්ෂණය කිරීම**

ශ්‍රී ලංකාවේ සංස්කෘතික හා ස්වභාවික උරුමයන් හඳුනා ගනිමින් දිගු කාලීනව සංරක්ෂණය කිරීම සහතික කිරීම සංචාරක ප්‍රතිපත්තිය මඟින් නිර්දේශ කරන අතර, ඒ සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන, පෞද්ගලික අංශයේ සහ එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන විසින් උරුම සංරක්ෂණය පිළිබඳ ගෝලීය ජාල සහ සම්මුතීන් සම්බන්ධව සැලකිලිමත්ව කටයුතු කළ යුතු වේ. තවද, ශ්‍රී ලංකාවේ ස්වාභාවික හා සංස්කෘතික ස්ථාන හඳුනා ගැනීම, ස්ථාපිත කිරීම සහ විද්‍යාව පදනම් කරගත් කළමනාකරණ ක්‍රමවේද මඟින් සංචාරක වත්කම් ප්‍රවර්ධනය කිරීමට හා පවත්නා සංචාරක ස්ථානවල ක්‍රියාකාරීත්වය යහපත් අයුරින් පවත්වාගෙන යාමට මග පෙන්වනු ලබයි. ජාත්‍යන්තර පිළිවෙත් හා ප්‍රවණතාවලට අනුකූල වන පරිදි, සංස්කෘතික ස්ථාන සහ ජාතික වනෝද්‍යාන (සාගර සහ භෞමික) සඳහා නීතිරීති සහ රෙගුලාසි වැඩිදියුණු

කිරීමට ද මෙම ප්‍රතිපත්තිය මගින් නිර්දේශ කර ඇත. සංචාරක ස්ථාන වලට රැගෙන යා හැකි සංචාරක ධාරිතාව සහ සංචාරක වාහන සඳහා වන අවම ප්‍රමිති (ශබ්ද සහ කාබන් විමෝචන මට්ටම) සහ සංවේදී ප්‍රදේශවල පවත්නා යටිතල පහසුකම් අනුව සංචාරක පීඩනය වැඩි වඩාත් දුර්වල ස්ථාන ආරක්ෂා කිරීම සඳහා ප්‍රවේශ දොරටු ස්ථාපිත කිරීම සඳහා ධාරිතා තක්සේරු කිරීම් සිදු කිරීම ඉතා අවශ්‍ය වේ.

**උපායමාර්ගය 2.3 - සංචාරක ප්‍රතිලාභ සාධාරණ ලෙස බෙදා හැරීම ඉහළ නංවමින් පුද්ගල කේන්ද්‍රීය හා දේශීය සම්පත් මත පදනම් වූ සංවර්ධනය උදෙසා නිෂ්පාදන සහ සේවා සඳහා මඟ පෙන්වන ප්‍රමිති සහ ආචාර ධර්ම සංවර්ධනය කිරීම**

නිසි නියෝජනයක් සහ ඵලදායී නියාමනයක් සහතික කිරීම සඳහා සංචාරක අංශ සහ උප අංශ වඩාත් පුළුල් ලෙස සංවිධානය කිරීම ද, ජාතික සංචාරක ප්‍රතිපත්තිය මගින් නිර්දේශ කර ඇත. දේශීය ප්‍රජාවට ප්‍රතිලාභ ලැබිය හැකි සංචාරක ව්‍යාපාරයේ උප අංශ (ප්‍රජා පාදක සංචාරක කර්මාන්තය, සුවතා, සම්මේලන සහ රැස්වීම්, පාරිසරික සංචාරක කර්මාන්තය, වික්‍රමාන්විත සංචාරක කර්මාන්තය, සහ විනෝද නෞකා සංචාරක කර්මාන්තය) හා සුවිශේෂී සේවා පිරිනමන උප අංශ (චිත්‍ර ශිල්පීන්, සාම්ප්‍රදායික නර්තන ශිල්පීන්, මෝටර් රථ කුලියට ලබා දීම ආදිය) නෛතික වශයෙන් පිළිගැනීම මෙයට ඇතුළත් වේ. අවිධිමත් සංචාරක අංශය සඳහා ආරක්ෂාව සැලසිය යුතු අතර, ලියාපදිංචි කිරීම දිරිමත් කිරීම සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් පිරිනැමීම සහ බදු අයකිරීම අත්හැරීම වැනි දිරිගැන්වීම් ක්‍රියාමාර්ග ඇතුළත් කළ හැක. කෙසේ වෙතත්, මෙම එක් එක් උප අංශය සඳහා මාර්ගෝපදේශ (ප්‍රමිති සහ ආචාර ධර්ම) සහ චර්යාධර්ම සංග්‍රහ සකස් කළ යුතුය. දේශීය සංචාරකයින් සහ ආබාධ සහිත සංචාරකයින් (වෙනස් ආකාරයක සැලකීම් වලට ලක් නොවන සහ සියල්ලන්ට ප්‍රවේශ විය හැකි සංචාරක කර්මාන්තයක්) සඳහා සේවා සැපයීම ඇතුළු ධාරිතාව ඉහළ නැංවීම සඳහා ප්‍රමුඛතා ලබා දිය යුතු ආයෝජන (යටිතල පහසුකම්, පුහුණුව) පිළිබඳව සලකා බැලිය යුතු ය. විවිධ සංචාරක පාර්ශවකරුවන් අතර සහ සංචාරක සැපයුම් දාමය පුරාම සාධාරණ මූල්‍ය සබඳතා පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා ප්‍රමිති සහ ආචාර ධර්ම පිළිබඳ අනුගමනය කළ යුතුය.

**උපායමාර්ගය 2.4 - තිරසරභාවය සහතික කිරීම සඳහා නියාමන රාමුවක් සහ ගෝලීයව පිළිගත් ප්‍රමිති සංවර්ධනය කිරීම**

අනාගතයේ දී සංචාරක අංශයේ වර්ධනය සඳහා ප්‍රධාන සාධක වනුයේ තිරසරභාවය සහ පාරිසරික අනුකූලතාවයයි. තිරසරභාවය පිළිබඳ සහතිකය සංචාරක වටිනාකම් දාමය හරහා වඩාත් පුළුල් ලෙස ක්‍රියාත්මක වන බව තහවුරු කිරීම සඳහා දේශීයව සහතිකයක් නිකුත් කිරීම සඳහා ස්වාධීන ප්‍රතීතන ආයතනයක් ස්ථාපිත කිරීම නිර්දේශ කරනු ලැබේ. මෙයට අවශ්‍ය නියාමන රාමුව සංවර්ධනය කිරීම කඩිනමින් සිදු කළ යුතුය. මෙම සහතිකය පිළිගත් ගෝලීය ප්‍රමිති හෝ ප්‍රතීතන ක්‍රමවලට අනුකූල විය යුතු සේම එය මෙරට විශාල අවිධිමත් සංචාරක අංශය මෙම ක්‍රියාවලියට සහභාගී කරවා ගැනීමට දේශීය වශයෙන් අදාළ වන පිරිමැසුම්දායී ක්‍රමයක් සකස් කළ යුතු ය.

**උපායමාර්ගය 2.5 - සංචාරක කර්මාන්තයේ ආයෝජන සහ සංවර්ධනය සඳහා හිතකර ව්‍යාපාරික පරිසරයක් සහතික කිරීම**

සංචාරක කර්මාන්තයේ ආයෝජන සහ සංවර්ධනය සඳහා හිතකර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම කර්මාන්තයේ වර්ධනය සහ තිරසරභාවය උදෙසා ඉතා වැදගත් වේ. නියාමන ක්‍රියාවලි සරල කිරීම සහ විධිමත් කිරීම මගින් ආයෝජකයින් වැඩි පිරිසක් මෙරටට ආකර්ෂණය කර ගැනීම, රැකියා අවස්ථා වැඩි සංඛ්‍යාවක් බිහි කිරීම, නිලධාරිවාදී බාධක අඩු කිරීම සහ තිරසර වර්ධනයක් සඳහා වඩාත් කාර්යක්ෂම සහ විනිවිදභාවයෙන් යුතු නියාමන රාමුවක් නිර්මාණය කිරීමට යෝජනා කර ඇත. සංචාරක කර්මාන්තයේ දියුණුව සඳහා අරමුදල් සම්පාදනය කර ගැනීම සඳහා වූ ප්‍රවේශය තීරණාත්මක සාධකයකි. ප්‍රාග්ධනය, ණය

සහ ආයෝජන දිරිගැන්වීම් සඳහා ප්‍රවේශයක් ඇතුළත් සහායක මූල්‍ය පරිසරයක් නිර්මාණය කිරීම ආයෝජකයින් වැඩි පිරිසක් ආකර්ෂණය කර ගැනීමට ඉවහල් වේ.

සංචාරක කර්මාන්තයේ අවශ්‍යතා සපුරාලීම සඳහා පුහුණු කිරීම් හා අධ්‍යාපන වැඩසටහන් හරහා මානව ප්‍රාග්ධනය වර්ධනය කිරීම මගින් කුසලතා සහ දැනුම වැඩිදියුණු කිරීම තුළින් වඩා හොඳින් සන්නද්ධ වූ ශ්‍රම බලකායක් නිර්මාණය කිරීමට උපකාරී වේ. ආගන්තුක සත්කාරය, පාරිභෝගික සේවා සහ භාෂා ප්‍රවීණතාවය වැනි ක්ෂේත්‍රවල පුහුණුව ලබාදීම මෙයට ඇතුළත් වේ.

**ප්‍රධාන තේමාව 3 - වැඩි දියුණු කළ සේවා ප්‍රමිති, ඵලදායි සම්බන්ධතා සහ දැනුවත් කරන ලද පාර්ශවකරුවන්**

| **ප්‍රතිපත්ති ප්‍රකාශනය:** |
|---|
| සංචාරක කර්මාන්තයේ ආරක්ෂාව තහවුරු කරන දේශීය නවෝත්පාදන අවකාශ සඳහා යටිතල පහසුකම් පුළුල් කරමින් නවෝත්පාදන ධාරිතාව වැඩි කිරීම සඳහා නව තාක්ෂණය මත පදනම් වූ ආයෝජන සඳහා පහසුකම් සැලසීම පිණිස සංචාරක කර්මාන්තය ඩිජිටල් පරිවර්තනයකට යොමු කිරීම සහතික කිරීම. |

**උපායමාර්ගය 3.1 - දත්ත එක්රැස් කිරීම, දත්ත විශ්ලේෂණය කිරීම සහ විස්තීර්ණ තොරතුරු කළමනාකරණ ක්‍රියාවලියක් සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම**

ගෝලීය සංචාරක වෙළෙඳපොළ තුළ ශ්‍රී ලංකාවේ තරඟකාරිත්වය ඉහළ නැංවීම පිණිස නිෂ්පාදන සංවර්ධනය වේගවත් විය යුතු ය. ඒ සඳහා, සංචාරක ප්‍රතිපත්තිය මගින් වෙළඳපළ කොටස් සහ නිෂ්පාදන සංවර්ධනය සම්බන්ධයෙන් දත්ත රැස් කිරීම සහ ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම ඇතුළුව, සංචාරක කර්මාන්තයේ බලපෑම් වඩා හොඳින් අවබෝධ කර ගැනීම සඳහා ප්‍රතිසංස්කරණ සිදු කිරීම සහ ප්‍රතිපත්ති රාමු සකස් කිරීම නිර්දේශ කර ඇත. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙහි පර්යේෂණ සහ ජාත්‍යන්තර සබඳතා අංශයේ ක්‍රියාකාරිත්වය ප්‍රතිසංස්කරණය කිරීම තුළින් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා අදාළ දත්ත සහ තොරතුරු පූර්ව අවශ්‍යතාවක් වන බැවින් ඒ සඳහා විස්තරාත්මක කළමනාකරණ ක්‍රියාවලියකට ප්‍රවේශ වීමට යෝජනා කර ඇත. දත්ත වලට ප්‍රවේශවීම සහ තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සහ පෞද්ගලික අංශය අතර දත්ත හුවමාරු කර ගැනීමේ නියමාවලියක් අවශ්‍ය වේ. එවැනි නියමාවලියකට අවබෝධතා ගිවිසුම් හරහා සංචාරක සම්මේලනය සහ විශ්ව විද්‍යාල සමඟ සම්බන්ධ විය හැක. මීට අමතරව,බොහෝ රටවලින් පැමිණෙන සංචාරකයින්ට ඔවුන් මෙරටට පැමිණෙන අවස්ථාවේ දී වීසා බලපත්‍ර ලබාගැනීමේ පහසුකම ලබා දිය යුතුය. සංචාරකයින්ට සුදුසු වීසා බලපත්‍රයක් සඳහා අයදුම් කරන බව සහතික කිරීමට සියලු ම කාණ්ඩවල (සංචාරක, ව්‍යාපාර, ආදිය) වීසා බලපත්‍ර මිල ගණන් පෙළගැස්විය යුතු අතර, එමඟින් විවිධ වෙළඳපළ කාණ්ඩ පිළිබඳව වඩා හොඳ අවබෝධයක් ලබා ගත හැක.

සංචාරක කර්මාන්තය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මගින් ජාතික උපාය මාර්ගික සැලැස්ම සමඟ පෙළගස්වන ලද අදාළ ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs) ඇතුළුව සංචාරක සංවර්ධනය නිරීක්ෂණය කිරීම සඳහා අධීක්ෂණ රාමුවක් ස්ථාපිත කිරීම ද දිරිමත් කර ඇත. සංචාරක ප්‍රතිපත්තියේ සඳහන් අදාළ උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා පුද්ගලික අංශයේ සාමාජිකයින්ද ඇතුළත් අන්තර් අමාත්‍යාංශ සංචාරක මෙහෙයුම් කමිටුවක් (ITSC) පිහිටුවීම ද නිර්දේශ කරයි.

**උපායමාර්ගය 3.2 - -සංචාරක අංශයේ සංවර්ධනය සඳහා වන ජාතික උපාය මාර්ග සමාලෝචනය කිරීම**

සංචාරක සංවර්ධනය උදෙසා වන ජාතික උපාය මාර්ග සමාලෝචනය කිරීම ද වැදගත් ක්‍රියාවලියක් වන අතර, වැඩිදියුණු කළ හැකි ක්ෂේත්‍ර හඳුනා ගනිමින් සංචාරක කර්මාන්තයේ තිරසර වර්ධනය සහතික කිරීමට එය උපකාරී වේ. සංචාරක කර්මාන්තයේ වෙනසක් ඇති කිරීම සඳහා දැනට පවත්නා උපාය මාර්ග පිළිබඳ පුළුල් විශ්ලේෂණයක් සිදු කිරීම සහ නව වක්‍රීය උපාය මාර්ග සකස් කිරීම අවශ්‍ය වේ. මෙම විශ්ලේෂණයට සංචාරක ප්‍රතිපත්ති, සැලසුම් සහ වැඩසටහන් පිළිබඳ සමාලෝචනයක් සිදු කිරීම මෙන් ම ඒවායේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා ද මෙම උපාය මාර්ගවල සඵලතාව පිළිබඳ ඇගයීමක් සිදු කිරීම ද ඇතුළත් විය යුතු බව දක්වා ඇත. තවද, සංචාරක සංවර්ධනය ප්‍රතිපත්ති සහ වැඩසටහන් සකස් කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී වර්ථමානයේ පවතින උපායමාර්ග, අදාළ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය, සංචාරක සංගම් සහ ප්‍රජා කණ්ඩායම් පිළිබඳ ප්‍රමාණවත් ඇගයීමක් කිරීම වැදගත් බව දක්වා ඇත.

**උපායමාර්ගය 3.3 - අලෙවිකරණ දර්ශනය නැවත උපාය මාර්ගිකව සකස් කිරීම**

ශ්‍රී ලංකාවේ අලෙවිකරණ ප්‍රවේශය 'අනාගතයට ගැළපෙන' අයුරින් ප්‍රතිනිර්මාණය කළ යුතුව ඇත. සාම්ප්‍රදායික වෙළඳ ප්‍රචාරණයේ සිට පරිශීලකයින් විසින් නිර්මාණය කරනු ලබන අන්තර්ගතයන් දක්වා අලෙවිකරණයේ ප්‍රගතිය සහ අලෙවිකරණ තොරතුරු ක්‍රියාමාර්ග මඟින් එවැනි වෙනසක් සඳහා පෙළඹවීමක් ලබා දෙනු ඇත. එමඟින් තවදුරටත් ගමනාන්තය ඉස්මතු කර නොදක්වන අතර, ස්වකීය තෘප්තිය සහ අප්‍රසාදය පළ කරන සංචාරකයා ඉස්මතු වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සංචාරකයින් විසින් උත්පාදනය කරන ලද සමාජ මාධ්‍ය අන්තර්ගතයන් වැඩි වශයෙන් නිරීක්ෂණය කිරීම මඟින් පහසුකම් සලස්වනු ලබන සංචාරක සැපයුමේ වඩා හොඳ ව්‍යුහගත කිරීමක් ජාතික සංචාරක ප්‍රතිපත්තිය මඟින් දිරිමත් කරනු ලබයි. සංචාරකයින්ගේ ප්‍රතිපෝෂණ හරහා නිෂ්පාදන සංවර්ධනය  කිරීම අඛණ්ඩව සිදු විය යුතු අතර, වෙනස්කම් වැලඳ ගැනීමට තරම් ක්ෂේත්‍රය ඉක්මන් විය යුතු ය. සංචාරක අත්දැකීම් ලබාගැනීම අඛණ්ඩව සිදු වන බව සැලකිල්ලට ගත යුතු අතර, දේශීය වෙළඳපොළ (දේශීය සංචාරක කර්මාන්තය සඳහා ජාතික උපාය මාර්ගයක් සංවර්ධනය කිරීම) කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු ය. විශේෂිත සහ විශේෂීකරණය කරන  ලද අංශවලට ක්ෂුද්‍ර වෙළඳපළ හරහා  තොරතුරු දැනුම් දෙනු ලබන ඔවුන්ගේ ම ප්‍රතිපෝෂණ චක්‍රයක් තිබිය යුතු ය (උදා: රැස්වීම්, දිරිගැන්වීම්, සම්මන්ත්‍රණ හා ප්‍රදර්ශන ආදී ඉලක්කගත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා MICE කාර්ය සාධක බලකායක් පිහිටුවීම). ශ්‍රී ලංකාවේ සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් පිළිබඳ  තොරතුරු හුවමාරු කර ගැනීමේ ස්ථාවරත්වය පවත්වා ගැනීමට සහ විශේෂිත වෙළඳපළ කොටස් (MICE, සුවතා සංචාරක, ආදිය) ප්‍රවර්ධනය සඳහා පුද්ගලික අංශයේ සහභාගීත්වය වැඩි කිරීමට හා එකට පෙළගැස්වීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA)  සහ පළාත් සභා අතර සන්නාමකරණය ප්‍රමිතිගත කිරීම  දිරිමත් කරනු ලැබේ.

**උපායමාර්ගය 3.4 - සංචාරක කර්මාන්තයේ සම්බන්ධතා නවීන තාක්ෂණය හරහා වැඩිදියුණු කිරීම**

සංචාරක කර්මාන්තය තුළ ඩිජිටල්කරණය සහ නවෝත්පාදන නිෂ්පාදන  වඩාත් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය නවීන තාක්ෂණය හරහා  සම්බන්ධතා වැඩිදියුණු කිරීමට ජාතික සංචාරක ප්‍රතිපත්තියේ උපාය මාර්ග ක්‍රියාත්මක කළ යුතු ය. සංචාරකයින්, හෝටල් හිමියන්, සංචාරක නියෝජිතයින්, ප්‍රවාහන සේවා සපයන්නන් සහ පළාත් පාලන ආයතන ඇතුළු සංචාරක කර්මාන්තයේ සියලු පාර්ශවකරුවන් සම්බන්ධ කරන විස්තීර්ණ ඩිජිටල් අවකාශයක් නිර්මාණය කිරීම සහ පුළුල් ඩිජිටල් අවකාශයක් සංවර්ධනය කිරීම අවශ්‍ය වේ. එම අවකාශය මඟින් තත්‍ය කාලීන තොරතුරු සැපයිය යුතු අතර සංචාරකයින්ට බාධාවකින් තොර ඒකාබද්ධ අත්දැකීමක් ලබා දෙමින් මාර්ගගත ක්‍රම තුළින් කලින් සේවා වෙන් කරවා ගැනීම් සහ ඒ සඳහා ගෙවීම් සිදු කිරීම සක්‍රීය කළ යුතුය.

සංචාරකයින්ට තොරතුරුවලට පහසුවෙන් ප්‍රවේශ වීමට හැකි වන පරිදි ඩිජිටල් අවකාශවල තොරතුරු වලට ප්‍රවේශ වීමේ හැකියාව වැඩි කිරීම මඟින් චාරිකා සැලසුම් කිරීමට සහ නවාතැන් හා ක්‍රියාකාරකම් කලින් වෙන්කරවා ගැනීමට හැකි වේ. සංචාරකයින්ට ඔවුන්ගේ සංචාර සැලසුම් සකස් කිරීමට සහය වෙමින්, මෙම අවකාශය හරහා දේශීය සංස්කෘතිය, ජාතික උරුම ස්ථාන සහ ආකර්ෂණීය ස්ථාන පිළිබඳ තොරතුරු ද සැපයිය යුතු ය. තවද, සේවා සඳහා ක්ෂණික ප්‍රවේශය ලබා දීම, කලින් සේවාවන් වෙන් කරවා ගැනීම සහ ඒවා සඳහා ගෙවීම් සිදු කිරීම පහසු කිරීම සඳහා ජංගම යෙදුම් සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ.

**උපායමාර්ගය 3.5 - දේශීය සම්පත් භාවිතා කරමින් සංචාරක ගමනාන්තය සඳහා නිපුණතා වැඩි දියුණු කිරීම**

ස්වාභාවික සම්පත්, සංස්කෘතික උරුමයන් සහ සම්ප්‍රදායික කුසලතා ඇතුළු සම්පත් ඵලදායී ලෙස උපරිම අයුරින් ප්‍රයෝජනයට ගැනීම සහතික කිරීම පිණිස දේශීය සම්පත් පිළිබඳ පුළුල් එකතුවක් පවත්වාගෙන යමින්, ඒවා සංචාරක කර්මාන්තයේ ප්‍රයෝජනය සඳහා උපයෝගී කර ගැනීමට උපාය මාර්ග සකස් කිරීම අවශ්‍ය වේ. ඉන් පසුව, ප්‍රාදේශීය ජනතාව සඳහා රැකියා අවස්ථා ඇති කිරීම, ව්‍යවසායකත්වය පෝෂණය කිරීම සහ කර්මාන්තයේ තිරසර සංවර්ධනයට දායක වීම යෝජනා කර ඇත.

එක් එක් සංචාරක කලාපයේ අවශ්‍යතා අනුව නිසි පරිදි සකස් කර ඇති ගමනාන්ත සඳහා ගමනාන්තය පදනම් කරගත් නිපුණතා වැඩසටහන් සැලසුම් කිරීම සිදු කළ යුතු ය. ආගන්තුක සත්කාරය, පාරිභෝගික සේවා සහ භාෂා ප්‍රවීණතාවය වැනි සංචාරක කර්මාන්තය ආශ්‍රිත කුසලතා පිළිබඳ ව ප්‍රදේශවාසීන් පුහුණු කිරීම සඳහා මෙම වැඩසටහන් සැලසුම් කළ යුතුය. එම නිපුණතා වැඩසටහන් දේශීය සම්පත් හා ප්‍රජාවන් සමඟ ඒකාබද්ධ කළ යුතු අතර, සංචාරක කර්මාන්තයේ ඉල්ලුමක් ඇති කුසලතා වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. සංචාරක කර්මාන්තයේ රැකියා සඳහා පුද්ගලයින් පුහුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරමින්, ව්‍යවසායකත්ව නිපුණතා සංවර්ධන වැඩසටහන් සිදු කළ යුතු ය. රජය විසින් ව්‍යාපාර කළමනාකරණය, මූල්‍ය සඳහා ප්‍රවේශය සහ අලෙවිකරණ සහාය ලබාදීම මඟින් දේශීය ව්‍යවසායකයින්ට සහාය ලබා දිය යුතු ය.

තවද, වඩාත් තිරසර සංචාරක කර්මාන්තයක් ඇති කිරීම සහ මානව සම්පත් උපාය මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම තුළින් ශ්‍රී ලංකාවේ සංචාරක නිෂ්පාදනවල ගුණාත්මක භාවය වෙනස් කිරීම කඩිනමින් කළ යුතු වේ. ශ්‍රී ලංකාව පුරා වඩාත් තරඟකාරී සංචාරක අංශයක් සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීම සහ පුහුණු කිරීම ප්‍රමිතිකරණය කිරීම එහි ප්‍රධාන අංගයක් වේ. ඒ සඳහා, වත්මන් පුහුණු ආයතනය වන ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය හෝ සංචාරක අමාත්‍යාංශය විසින් නියම කර ඇති අවම ප්‍රමිතීන්ට අනුකූලව මාර්ගෝපදේශ හා ප්‍රතීතන ක්‍රියාවලියක් හරහා ඒවායේ බලපත්‍ර, පාඨමාලා විෂයමාලාව සහ පුහුණු කිරීම වැඩිදියුණු කර ප්‍රමිතිගත කළ යුතු බව ප්‍රතිපත්තිය මඟින් නිර්දේශ කරනු ලැබේ.

**ප්‍රධාන තේමාව 4 - නව ගමනාන්ත සංවර්ධනය, සංචාරක කර්මාන්තය ඔරොත්තු දෙන අයුරින් ගොඩනැගීම සහ දිරිගැන්වීමේ උපාය මාර්ග ඇති කිරීම.**

| **ප්‍රතිපත්ති ප්‍රකාශනය:** |
| --- |
| පාරිභෝගික අවශ්‍යතාව හා අභිරුචිය අනුව සැලසුම් කරනු ලබන විචක්ෂණශීලී සංචාර වලින් හෙබි සංචාරක අත්දැකීම් වැඩිදියුණු කරන වෙළඳපළ ප්‍රතිසංස්කරණය කිරීම තුළින් ඉහළ යන සංචාරක ඉල්ලුමෙහි නවීනත්වය සමඟ ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය නිවැරදිව ස්ථානගත කර සහතික කිරීම සහ කර්මාන්තයේ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම සහතික කිරීම. |

**උපායමාර්ගය 4.1 - ශ්‍රී ලංකාවේ ස්වාභාවික හා සමාජ සංස්කෘතික උරුමයන්හි ආකර්ෂණය තුළින් නව සංචාරක ගමනාන්ත සහ නිෂ්පාදන සංවර්ධනය කිරීම**

නව සංචාරක ගමනාන්ත සහ නිෂ්පාදනයන් සංවර්ධනය කිරීමේදී එම සංචාරක ස්ථාන, නිෂ්පාදන සහ සේවා සමඟ සම්බන්ධ වීමට සංචාරකයින්ට අවස්ථාව ලබා දීම අත්‍යවශ්‍ය වේ. මෙමගින් අපගේ සංස්කෘතික හා පාරිසරික උරුමයන් සම්බන්ධ කිරීම, (උදා: ගුවන්, බස් සහ කුලී රථ වැනි ප්‍රවාහන මාධ්‍ය අතර වඩා හොඳ සම්බන්ධතාවයක් සහතික කිරීම) ගමනාන්ත ආරක්ෂිත ස්ථාන බවට පත් කිරීම සහ විද්‍යුත් ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම (e- ticketing) වැනි වැඩිදියුණු කළ සබැඳි සේවා සැපයීම හරහා සංචාරක ස්ථාන සහ නිෂ්පාදන කරා පහසුවෙන් ප්‍රවේශ වීමේ හැකියාව සහතික කිරීම මෙම උපාය මාර්ගයට ඇතුළත් වේ.

**උපායමාර්ගය 4.2 - ව්‍යාපාරික පරිසරය තරගකාරී ලෙස ස්ථානගත කිරීම සහ වැඩිදියුණු කිරීම**

සංචාරක කර්මාන්තයේ තරඟකාරිත්වයට අන්තර් සම්බන්ධිත සාධක කිහිපයක් බලපායි. සංචාරක කර්මාන්තය අපනයන කර්මාන්තයක් ලෙස පිළිගැනීම ඉන් ප්‍රධාන කරුණක් වේ. තවද, බදු වංචා සහ බදු ගෙවීම පැහැර හැරීම ආදිය වැළැක්වීමට විසඳුම් ලබා දීම හා සංචාරක අංශයේ නවාතැන් වර්ගීකරණ පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම ඇතුළුව, විවිධ ක්ෂේත්‍ර අතර වඩාත් ප්‍රතිපත්තිමය අනුකූලතාවක් ඇති කිරීම මඟින් පුද්ගලික අංශයට වඩාත් තරඟකාරී වීමට ඉඩ සලස්වනු ලැබේ. මෙම වර්ගීකරණය සහ කාණ්ඩ ගත කිරීම තනි ව්‍යාපාර සඳහා මෙන්ම සපයනු ලබන සේවාවන්හි ගුණාත්මකභාවය ප්‍රවර්ධනය කිරීමට කැමති ගමනාන්ත සඳහා ද ප්‍රයෝජනවත් අලෙවිකරණ අවකාශ සපයනු ලබයි. එම දෘෂ්ටිකෝණයෙන් ගත්කල, සංචාරක ප්‍රතිපත්තිය මගින් යෝජනා කරනුයේ වර්ගීකරණ ක්‍රමය සහ එය අනුගමනය කිරීම සඳහා වන මාර්ගෝපදේශ පිළිබඳ නිරන්තර සමාලෝචන සිදු කිරීම, විශේෂයෙන් තාක්ෂණය සහ ප්‍රවේශ්‍යතාව සම්බන්ධයෙන් ශීඝ්‍රයෙන් වෙනස්වන පාරිභෝගික අවශ්‍යතා සමඟ යාවත්කාලීන වීම ප්‍රයෝජනවත් විය හැකි බවයි.

එම දර්ශනය තුළ සංචාරක පාර්ශවකරුවන් විගණනය කිරීම සඳහා ස්වාධීන විගණන සමාගමක් පත් කළ හැක. විදේශීය ආයෝජකයින් සහ කාර්ය මණ්ඩල සඳහා කම්කරු නීති සහ වීසා බලපත්‍ර ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය කිරීම ද ජාතික සංචාරක ප්‍රතිපත්තිය මඟින් නිර්දේශ කර ඇත. විදේශීය ආයෝජකයින් සහ සේවකයින් මෙරට සේවය කරන අවස්ථාවන්හිදී බදු ගෙවීම පැහැර හැරීම වැළැක්වීම සහ මඟ හැරවීම සඳහා ඔවුන්ගේ හැසිරීම් දැඩි ලෙස නියාමනය කළ යුතුය. අවිධිමත් පාර්ශවකරුවන්ගේ ප්‍රමාණය සහ බදු ගෙවීම් පැහැර හැරීම අවම කිරීම සඳහා කඩිනම් කරන ලද ඩිජිටල්කරණ නියාමන පද්ධතියක් (ආයෝජකයින් කඩිනම් අනුමත කිරීමේ ක්‍රමයක් ඇතුළුව) සහ මාර්ගගත අධීක්ෂණ සිදු කිරීම තුළින් ශ්‍රී ලංකාවේ සාධාරණ ව්‍යාපාරික පරිසරයක් ඇති කිරීම වැදගත් වේ.

**උපායමාර්ගය 4.3 - තිරසර සහ වගකීම් සහිත සංචාරක සංවර්ධනයක් සඳහා දිරිගැන්වීම් සිදු කිරීම**

මෙම උපාය මාර්ගයේ හරය වන්නේ හරිත හා සංගෘහිත සංවර්ධනයක් ඇති කිරීමයි. තිරසර සහ වගකීම් සහිත සංචාරක නිෂ්පාදන සහ සේවාවන් පිරිනැමීමට උනන්දුවක් දක්වන ආයතන සඳහා ආයෝජන දිරිගැන්වීම් සහ වට්ටම් ශ්‍රී ලංකා රජය විසින් ලබා දිය යුතු බව මෙම උපාය මාර්ගය මගින් යෝජනා කර ඇත. ශ්‍රී ලංකාවේ පාරිසරික සවිඥානික, සමාජීය වශයෙන් සංගෘහිත හා ඔරොත්තු දෙන සංචාරක කර්මාන්තයක් ගොඩනැගීමේදී ක්‍රියාකාරීව කටයුතු කිරීමට මෙම දිරිගැන්වීම් ක්‍රියාවලිය මගින් පුද්ගලික අංශයේ පාර්ශවකරුවන් දිරිමත් කරනු ලැබේ. තිරසරභාවය කරා යන ගමනේ දී අනාගත සංචාරක උපාය මාර්ග මගින් සලකා බැලිය යුත්තේ ඩිජිටල් නවෝත්පාදන වලට සහ නව ඩිජිටල් සංචාර ගතිකත්වයන්ට වැඩි කාර්යභාරයක් ඉටු කළ හැක්කේ කුමන ආකාරයකට ද යන්න පිළිබඳවයි.

**උපායමාර්ගය 4.4 - සංචාරකයින්ගේ සුරක්ෂිතභාවය සහ සෞඛ්‍ය ආරක්ෂාව වැඩි දියුණු වන ලෙස සංචාරකයින්ගේ අත්දැකීම් පරිවර්තනය කිරීම**

සංචාරකයින්ට ආකර්ෂණීය සංචාරක ගමනාන්තය සමඟ සම්බන්ධ වීමට හිමිවන අවස්ථා වැඩි කිරීම සහ එම ගමනාන්තයේ සංචාරක ස්ථාන, නිෂ්පාදන සහ සේවාවන් කරා ප්‍රවේශ වීමේ දී ඇති විය හැකි බාධා වැළැක්වීම අත්‍යවශ්‍ය වේ. ගමනාන්ත අතර සම්බන්ධතා (උදා: ප්‍රවාහන මාධ්‍යයන් අතර වඩා හොඳ සම්බන්ධතාවයක් සහතික කිරීම සඳහා ප්‍රවාහන ක්ෂේත්‍රය සමඟ එක්ව කටයුතු කිරීම) හා ගමනාන්ත සැමට ප්‍රවේශ විය හැකි ආරක්ෂිත ස්ථාන බවට පත් කිරීම සහ වැඩිදියුණු කළ සේවාවන් ලබා දීම හරහා සංචාරක නිෂ්පාදන කරා පහසුවෙන් ප්‍රවේශ වීමේ හැකියාව සහතික කිරීම මෙයට ඇතුළත් වේ.

මෘදු මත්පැන් අලෙවි කිරීම සම්බන්ධයෙන් සංචාරකයන්ගේ අත්දැකීම් වල අනුකූලතාවය සැලකිල්ලට ගනිමින් පාර්ශවකරුවන් අතර ස්ථාවර ප්‍රතිපත්තියක් ඇති කිරීම වැදගත් වේ. තවද, මෘදු මත්පැන් සඳහා අවසර ලබා දීමේ ක්‍රියා පටිපාටිය තාර්කික විය යුතු අතර හැකි සෑම විටම විමධ්‍යගතකරණයකට ලක් කළ යුතුය. මෙම උපාය මාර්ගයට සංචාරකයින්ගේ ආරක්ෂාව, සෞඛ්‍යය සහ සුරක්ෂාව වැඩි දියුණු කිරීම, විශේෂයෙන් හුදකලා/තනිව පැමිණෙන කාන්තා සංචාරකයින්ට සිදු විය හැකි හිරිහැර වළක්වා ගැනීමට පියවර ගැනීම සහ සුරක්ෂිත මාර්ගෝපදේශන හා ප්‍රවාහනය වැඩිදියුණු කිරීම වැදගත් අනු උපායමාර්ගයක් ලෙස ඇතුළත් වේ. සංචාරක ආරක්ෂාව සහ සේවා සපයන්නන්ට සාධාරණව සැලකීම සහතික කිරීම සඳහා යාවත්කාලීන කරන ලද රෙගුලාසි සහ චර්යා සංග්‍රහ අවශ්‍යවනුයේ නව්‍යකරණ සංචාරක ප්‍රවාහන සහ සේවාවන් සැපයීම සඳහාය. අනිවාර්ය රක්ෂණාවරණ ඔප්පු සහ ලියාපදිංචි අංක ලබා ගැනීම හරහා සංචාරකයින් ආරක්ෂා කිරීම සහ අසාධාරණ තරඟකාරිත්වය සීමා කිරීම සඳහා සියලු ආකාරයේ වාහන සහ ත්‍රාසජනක ක්‍රීඩා උපකරණ කුලියට දීම නියාමනය කිරීමද මෙයට ඇතුළත් වේ. තවද, විදේශීය සංචාරකයින් සඳහා ජාත්‍යන්තර රියදුරු බලපත්‍ර (IDPs) නිකුත් කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම ද මෙම උපාය මාර්ගය මඟින් නිර්දේශ කර ඇත.

**උපායමාර්ගය 4.5 - වෙළඳපළ පිළිබඳ දැනුවත්භාවය සහ පර්යේෂණ අවස්ථා වැඩිදියුණු කිරීම**

සංචාරක කර්මාන්තය පිළිබඳ වෙළඳපළ තොරතුරු වැඩිදියුණු කිරීම සහ ඉහළ නැංවීම සඳහා ඉලක්කගත සංචාරකයින් හඳුනා ගැනීමත්, ඔවුන්ට අවශ්‍ය වන්නේ කුමක් ද හා ඔවුන් සංචාරය කිරීමට පොලඹවන්නේ කුමන සාධක ද යන්න හඳුනා ගැනීම අවශ්‍ය වේ. එමෙන්ම, නව සංචාරක ප්‍රවණතා හා තරඟකාරිත්වයන් මෙන්ම කලාපයේ සංචාරක කර්මාන්තයට බලපෑම් ඇති කළ හැකි අනෙකුත් සාධක ද අවබෝධ කර ගැනීම සඳහා වෙළඳපළ පර්යේෂණ පැවැත්වීම අවශ්‍ය වේ. විශේෂ නිකේතන වෙළඳපල කොටස් අවබෝධ කර ගැනීම සඳහා, දත්ත විශ්ලේෂණ කිරීම, අලෙවිකරණ උපාය මාර්ගවල සඵලතාවය මැනීම, පාරිභෝගික හැසිරීම් රටා අවබෝධ කර ගැනීම සහ වැඩිදියුණු කිරීම සඳහා සංචාරක ගමනාන්ත හඳුනා ගැනීම වැනි කරුණු සැලකිල්ලට ගැනීම සඳහා යෝජනා කරනු ලබයි. සංචාරකයින් වැඩි පිරිසක් ගමනාන්තයට ආකර්ෂණය කර ගැනීම පිණිස සංවර්ධනය සඳහා ඇති අවකාශ හඳුනා ගැනීමටත්, ආයෝජනවල ප්‍රතිලාභ උපරිම කිරීමටත්, අලෙවිකරණ උපාය මාර්ග සකස් කිරීමටත් එම සාධක උපකාරී වනු ඇත.